ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"ඔබගේ සැබෑකමෙහි මා හුරුවමින් මට ඉගැන්වුව මැනව මක්නිසාද, ඔබ මාගේ ගැලවීමේ දෙවියන් වහන්සේය." (ගීතාවලිය 25 :5)

81 වන වෙළුම අංක 06 (966) **2022 නොවැම්බර් / දෙසැම්බර්**

ශුද්ධාත්මයාණන් වහන්සේ මුළු සත්‍යයකරා අපට මඟපෙන්වන සේක

"නුඹලාට කියන්ට තව බොහෝ දේවල් මට ඇත්තේය. නුවුන් දැන් ඒවා දරන්ට නුඹලාට බැරිය. එසේ වී නුවුන් උන්වහන්සේ එනවි, සැබෑකමේ ආත්මයාණන් වහන්සේ ආ කළ උන්වහන්සේ මුළු සත්‍යය කරා නුඹලාට මඟපෙන්වන සේක. මක්නිසාද උන්වහන්සේ තමන්ගෙන්ම උපදවා කථා නොකර, උන්වහන්සේ අසන දේ කියා පැවිසෙන්ට තිබෙන දේ නුඹලාට ප්‍රකාශ කරන සේක. උන්වහන්සේ මා ගෞරවයට පත්වන්න සේක. මක්නිසාද උන්වහන්සේ මා සන්තක දෙයින් රැගෙන නුඹලාට ප්‍රකාශ කරන සේක." (යොහාන් 16:12-14)

අපි මනුෂ්‍යයන්ගෙන් බොහෝ දේ ඉගෙන ගන්නවා වුවත් අපි ඔවුන් මත රැඳී සිටින්නේ නැත. ශුද්ධාත්මයාණන් වහන්සේ දිව්‍යමය ගුරුවරයාණන් ලෙස අපට සිටින සේක. මෙසේ ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන අපට කෙලින්ම සත්‍යය උගන්වන තෙක් අපි කිසිදාක සත්‍යය දැනගනු ලබන්නේ නැත. අපගේ ගුරුවරුන් කවුරුන් වුවත් මනුෂ්‍යය ඉගැන්වීම් අපට කොතෙකුත් ලැබුණත් ශුද්ධාත්මයාණන් වහන්සේ සත්‍යය පිළිබඳව අපට නිවැරදි සහ සම්පූර්ණ අවබෝධයක් ලබාදෙයි. ඉංග්‍රීසි භාෂාවෙන් හෝ බයිබලය ලියවී ඇති මුල් භාෂා වලින් දේව වචනය අධ්‍යයනය කිරීමෙන් පවා අපට සත්‍යය පිළිබඳව සැබෑ අවබෝධයක් ලබාදෙන්නේ නැත. ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් කෙලින්ම අපට ඉගැන්විය යුතු අතර අප අතරේ සිටින ඕනෑම කෙනෙකුට ඉගැන්වීමට උන්වහන්සේට හැකිව සිටින සේක. හෙබ්‍රෙව් ග්‍රීක් භාෂාවන් සහ අනෙකුත් සංජනන භාෂාවන් දැන සිටියත් ආත්මයාණන් වහන්සේගේ ඉගැන්වීම නැති නම් ඒ කිසිවකින් දෙවියන් වහන්සේගේ සත්‍යතාවය දැනගත නොහැකිය. ඒ කිසිවක් නොදැන සිටියත් ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඉගැන්වීම තිබේ නම් දෙවියන් වහන්සේගේ සත්‍යතාවය අවබෝධ කරගත හැකිවේ.

මෙසේ ආත්මයාණන් විසින් උගන්වනු ලබන තැනැත්තාට මුළු සත්‍යයකරා මඟ පෙන්වන සේක. දෙවියන් වහන්සේගේ මුළු සත්‍යතාවය අප සියල්ලන්ටම වේ. නමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ එක දවසකින්, සතියකින්, අවුරුද්දකින් සියලුම සත්‍යතාවයන් වෙත අපව මෙහෙයවන්නේ නැත. නමුත් පියවරෙන් පියවර ඒ වෙන අපව යොමු කරවනු ලබන සේක.

ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේව අනාවරණය කරන සේක.

"උන්වහන්සේ මා ගෞරවයට පත්වන්න සේක. මක්නිසාද උන්වහන්සේ මා සන්තක දෙයින් රැගෙන නුඹලාට ප්‍රකාශ කරන සේක." (යොහාන් 16:14)

ඇදහිලිවන්තයාට මෙන්ම නොඇදහිලිවන්තයාට ද යේසුස් ක්‍රිස්තුස් වහන්සේව උගන්වන්නා වූ විශේෂ වූ මාර්ගය ශුද්ධාත්මයාණන් වහන්සේ වන සේක. අන් සියල්ලටම වඩා යේසුස් වහන්සේව හෙළිදරව් කිරීම සහ උන්වහන්සේව මහිමයට පත්කිරීම ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්යයයි. උන්වහන්සේගේ ඉගැන්වීමේ කේන්ද්‍රස්ථානය ක්‍රිස්තුස් වහන්සේ තුළ වන සේක. එක් පැත්තකින් හෝ තවත් ආකාරයකින් ශුද්ධාත්මයාණන් වහන්සේ අපව යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙතට ගෙන එන සේක.

ක්‍රිස්තුස් වහන්සේව අපකීර්තියට පත්වේ කියා ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳ සත්‍යතාවය අනාවරණය කිරීමට සමහරු බිය වෙති. නමුත් ශුද්ධාත්මයාණන් වහන්සේ මෙන් ක්‍රිස්තුස් වහන්සේව මහිමයට පත්කරන කිසිවෙක් නැත. ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ක්‍රිස්තුස් වහන්සේව පහදා දෙන තුරු අපි කිසිවිටෙකත් ක්‍රිස්තුස් වහන්සේව තේරුම් නොගන්නෙමු. උන්වහන්සේගේ මහිමය නොදකින්නෙමු. දේශනාවලට හා ඉගැන්වීම්වලට කොයිතරම් ඇහුම්කන්දී තිබුණත්, කොපමණ හැකියාවක් තිබුණත්, කොපමණ දේව වචනය අධ්‍යයනය කර තිබුණත්, ක්‍රිස්තුස් වහන්සේගේ කාරණා දැකීම අපට ලබා දෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ වන සේක. ශුද්ධාත්මයාණන් වහන්සේ අපට ක්‍රිස්තුස් වහන්සේව ප්‍රකාශ කිරීම අවශ්‍යව තිබෙන සේක. උන්වහන්සේ එය ඉටුකිරීමට කැමැත්තෙන් සිටින අතර උන්වහන්සේට එය කළ හැකිව තිබෙන සේක. මනුෂ්‍යයාට ක්‍රිස්තුස් වහන්සේව අනාවරණය කිරීම ශුද්ධාත්මයාණන් වහන්සේගේ දැඩි ආශාව වන සේක.

පෙන්තකොස්ත දවසේ දී ප්‍රේත්‍රුස් ඇතුලු පිරිස ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පිරුණු විට ඔවුන් ශුද්ධාත්මයාණන් වහන්සේ ගැන වැඩි යමක් කථා නොකල නමුත් ඔවුන් ක්‍රිස්තුස් වහන්සේ ගැන කථා කළෝය. එදින ප්‍රේත්‍රුස් කළ දේශනාව අධ්‍යනය කරන්න. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඔහුගේ එකම තේමාව වූ අතර ආත්මයාණන් වහන්සේ අපට උගන්වන එකම තේමාව ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ වනු ඇත. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අපගේ දර්ශනය සම්පූර්ණයෙන්ම ග්‍රහණය කරගනු ඇත. තේජාන්විත ක්‍රිස්තුස් වහන්සේව අපට ලබාදෙනු ඇත.

අපට හමු වූ මේ ක්‍රිස්තුස් වහන්සේ කොයිතරම් තේජාන්විතද .. ? අපට මුණ ගැසෙන්නා වූ සෑම කෙකුටම අපි උන්වහන්සේ ගැන කියන්නට ආශාවෙන් සිටින්නෙමු. ආත්මයාණන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ ගැන අපට මඟ පෙන්වමින් උන්වහන්සේව මහිමයට පත්කරන විට බොහෝ වෙනස් දේ සිදු වේ.

ආර්.ඒ. ටෝර් විසිනි.

ආත්මයාණන් වහන්සේ ගැඹුරු දේ අනාවරණය කරන සේක.

"නුවුන් ලියා තිබෙන ලෙස දෙවියන් වහන්සේ විසින් තමන් ප්‍රේම කරන්නන්ට සූදානම් කළ යම් දෙයක් අස්සේ ඒ දේ ඇසට නොපෙනුනේය. කණට නොඇසුණේය. මනුෂ්‍යයාගේ සිතට නොපැවිණෙන්නේය. නමුත් දෙවියන් වහන්සේස්වකීය ආත්මයාණන්වහන්සේකරුණුකොටගෙන අපට ඒ දේ එළිදරව් කළ සේක. මක්නිසාද ආත්මයාණන් වහන්සේ සියළු දේ එසේය, දෙවියන් වහන්සේගේ ගැඹුරු දේවල් විවසන සේක. මනුෂ්‍යයෙකුගේ කාරණා මනුෂ්‍යයා තුළ තිබෙන ඔහුගේ ආත්මය හැර මනුෂ්‍යයන් අතරේ වෙන කවරෙක් දන්නේද..? එසේම දෙවියන් වහන්සේගේ කාරණා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් විස වෙන කිසිවෙක් නොදනියි. නමුත් දෙවියන් වහන්සේ විසින් අපට දෙන ලද්දේ අප විසින් දැනගන්නා පිණිස ලෝකයේ ආත්මය නොව දෙවියන් වහන්සේගෙන් වූ ආත්මය ලැබීමුව. අප විසින් ඒ දේවල් කථා කරන්නෙත් මනුෂ්‍ය ප්‍රඥාව කරුණුකොටගෙන උගන්වන ලද වචනවලින් නොව ආත්මික දේවල් ආත්මික දේ සමඟ සමාන කර බලමින් ආත්මයාණන් වහන්සේ විසින් උගන්වන ලද වචන වලිනි." (1 කොරින්ති 2:9-13)

ආත්මයාණන් වහන්සේ පුද්ගලිකව ඇදිහිලිවන්තයාට දෙවියන් වහන්සේගේ ගැඹුරු දේවල්, මනුෂ්‍යයාගේ ඇසින් නොදුටු, කණින් නොඇසූ, මිනිසාගේ හදවතට ඇතුල් නොවූ, දෙවියන් වහන්සේ ප්‍රේම කරන්නන් උදෙසා පිළියෙල කර ඇති දේ එළිදරව් කරනු ලබයි. මෙය සම්පූර්ණයෙන්ම ස්වර්ගයට හෝ මතු පැමිණෙන ජීවිතයට පමණක් අදාළ දේවල් නොවන බව බයිබල් පසුබිමෙන් පැහැදිලි වේ. ශුද්ධාත්මයාණන් වහන්සේ විසින්, දෙවියන් වහන්සේ දැන් පවතින අපගේ ජීවිතවලට සූදානම් කර ඇති දෙවියන් වහන්සේගේ ගැඹුරු දේවල් එලිදරව් කරන සේක.

ආත්මයාණන් වහන්සේ, දෙවියන් වහන්සේගේ වචනය පරිවර්තනය කරන සේක.

ඊළඟට අපි කියවන්නේ මෙසේය. නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ කාරණා පිලිනොගනියි. ඒවා ඔහුට මෝඩකමය. ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය. (1 කොරින්ති 2:14)

2 පිටුවට

1 පිටුවෙන්

ශුද්ධාත්මයාණන් වහන්සේ මුල්...

ශුද්ධාත්මයාණන් වහන්සේ, ලියන ලද දෙවියන් වහන්සේගේ වචනය එළිදරව් කිරීමේ කතෘවරයා පමණක් නොව, උන්වහන්සේ එළිදරව්කර තිබෙන්නේ මොනවාද කියාත් අනාවරණය කරන සේක. ඕනෑම ගැඹුරු ග්‍රන්ථයක් අපට අර්ථ නිරූපණය කිරීමට පොතේ කතෘවරයා අප ළඟ සිටින විට එය කොපමණ අනර්ඝව හා ප්‍රයෝජනවත්ව තිබෙනවාද ..? බයිබලයේ කතෘවරයාණන් වන ශුද්ධාත්මයාණන් වහන්සේ අප සමඟ සිටීම සැමවිටම අපට ඇති වරප්‍රසාදයකි. ශුද්ධාත්මයාණන් වහන්සේ බයිබලයේ කතෘවරයා වන අතර සෑම ඇදහිලිවන්තයෙක්ම බයිබලය විවෘත කරන සෑම විටම එහි අර්ථය නිරූපණය කරදීමට සූදානමින් සිටින සේක.

බයිබලය තේරුම් ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ දෙස බැලිය යුතුය. එවිට අපැහැදිලි ස්ථාන පැහැදිලි වේ. අතීතයේ දී ගීතිකාකරුවා යාච්ඤා කලාක් මෙන් අපි යාච්ඤා කළ යුතුය. "ඔබගේ ව්‍යවස්ථාවෙන් ආශ්චර්යමත් දේ දක්නා පිණිස මාගේ ඇස් පැහැදුව මැනව." (ගීතාවලිය 119:18) අධ්‍යනය කිරීම සඳහා දෙවියන් වහන්සේගේ ලියන ලද එළිදරව්ව අප ඉදිරියේ තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. අප එය අධ්‍යයනය කරද්දී ග්‍රහණය කර ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේගේ ඇතුළාන්ත ආලෝක කිරීම තිබිය යුතුය. ස්වභාවික අවබෝධය සමඟ ආත්මික එළිදරව්වක් අවබෝධ කර ගැනීමට උත්සාහ කිරීම පොදුවේ සිදුවන වැරැද්දක් නමුත් එය ඉතා පැහැදිලිව තිබෙන වරදකි.

අතීතයේ සිටි යුදෙව්වන්ට ආත්මයාණන් වහන්සේගේ එළිදරව්වක් තිබූ නමුත් එය ඔවුන්ට අර්ථකතනය කර ගැනීමට ආත්මයාණන් වහන්සේ මත යැපීමට අපොහොසත් වූවෝය. එබැවින් ඔවුන් නොමඟ ගියෝය. අද දවසේ දී ද කිතුණුවන්ට ආත්මයාණන් වහන්සේගේ එළිදරව්වක් ඇති අතර බොහෝ දෙනෙක් එය අර්ථකතනය කර ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ මත යැපීමට අපොහොසත් වන නිසා ඔවුන් නොමඟ යති. මුළු ඉවැන්ජලිස්ත සභාවම න්‍යායාත්මකව අවම වශයෙන් මනුෂ්‍යයාගේ තම ධර්මිෂ්ඨකම ප්‍රමාණවත් නොවන බව හඳුනාගනියි. මේ වර්තමාන පැයේදී ද එයින් උගන්වනු ලබන දේ සහ දැනෙන්නට සලස්වන දේ තේරුම් ගැනීමට මනුෂ්‍යය ප්‍රඥාව ප්‍රමාණවත් නොවේ. දෙවියන් වහන්සේගේ වචනය තේරුම් ගැනීමට නම් අපි අපගේම ප්‍රඥාවෙන් සම්පූර්ණයෙන්ම හිස් විය යුතු අතර එය අර්ථකථනය කිරීමට දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේමත සම්පූර්ණයෙන්ම රදා සිටිය යුතුය. යේසුස් වහන්සේ ප්‍රකාශ කළ වචන අපගේ සිතේ තබා ගනිමු. **"ඒ ප්‍රස්ථාවේ දී යේසුස් වහන්සේ උත්තර දෙවින් කියන සේක්, ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමී වූ පියාණෙනි, ඔබ වහන්සේ ප්‍රඥාවන්තයන්ගෙන් ද, තේරුම් අත්තනන්ගෙන් ද මේ කරුණා සඟවා ළදරුවන්ට එළිදැක්වී කළ බැවින් ඔබට ස්තුති කරමි."** (මතෙව් 11:25)

දේව වචනය අවබෝධ කර ගැනීමට ආත්මයාණන් වහන්සේ දවස්පතා අපට ඉගැන්විය යුතුවේ. ආත්මයාණන් වහන්සේ අපට ඊයේ දවසේ ඉගැන්වූ දේ මත අද දවසේ යැපෙන්නට අපට නුපුළුවන. අපි දේව වචනය සමඟ සම්බන්ධ වන සෑම අළුත් අවස්ථාවකදීම එම නිශ්චිත අවස්ථාව සඳහා ආත්මයාණන් වහන්සේගේ බලය තිබිය යුතුය. ශුද්ධාත්මයාණන් වහන්සේ වරක් අපගේ සිත ආලෝකමත් කළ පසු එය ග්‍රහණය කර ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. එම ඡේදයට අපි යොමු වෙන සෑම අවස්ථාවකදීම ශුද්ධාත්මයාණන් වහන්සේ එලෙස ආලෝකමත් කිරීම කළ යුතුය.

ආත්මයාණන් වහන්සේ බලය ලබා දෙන සේක

පාවුල්තුමා මෙලෙස පැවසුවේය. **"ඒ හැටියට සහෝදරයෙනි, මා නුඹලා වෙතට ආකල්හි දෙවියන් වහන්සේගේ රහස නුඹලාට එළිදැක්වී කරමින් ආවා විස කතාවෙවත් ප්‍රඥාවෙවත් උත්කර්ෂයෙන් යුක්තව නාවෙවි. වක්නිසාද යේසුස් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේ කුරුසියෙහි අයුණ ගසනු ලැබූ බවත් විස වෙන කිසිවක් නුඹලා අතරෙහි නොදැන සිටින්ට නියමකර ගතිවි. මම දුර්වලකමින්ද, බයින්ද, බොහෝ වෙවුලුවෙන්ද නුඹලා සමඟ සිටියෙවි. මගේ කතාවත්, මගේ දේශනා කිරීමත් ප්‍රඥාවේ සිත් පොළඹවන්නා වූ වචන වලින් නොව ආත්මයාණන් වහන්සේගේ ද, බලයේ ද ප්‍රකාශ කිරීමෙන් විය. එසේ වුනේ නුඹලාගේ අදහිල්ල දෙවියන් වහන්සේගේ බලයෙන් විස මනුෂ්‍යයාගේ ප්‍රඥානේ නොපිහිටන පිණිසය. "** (1 කොරින්ති 2:1-5)

ඒ ආකාරයෙන්ම තෙසලෝනික සභාවේ අයටද පැවසුවේය. "මක්නිසාද අපේ සුභාරංචිය නුඹලා වෙතට පැමුණුනේ වචනයෙන් පමණක් නොව බලයත්, ශුද්ධාත්මයත්, බොහෝ නිසැකකමත් ඇතුවය. එසේය, නුඹලා නිසා අපි නුඹලා අතරෙහි කොයි ආකාර අය වීමුදැයි නුඹලා දන්නහුය. (1 තෙසලෝනික 1:5)

අපට අවශ්‍ය වන්නේ තෝරාගත් ප්‍රේරිතයන්ට සහ අපේස්තුළුවරුන්ට ප්‍රථමයෙන් සත්‍යතාවය අනාවරණය කළ ශුද්ධාත්මයාණන් වහන්සේව පමණක් නොව, දෙවනුව ඒ ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණුකොටගෙන සත්‍යතාවය පුද්ගලිකව අපට අර්ථකථනය ලබාදීමටත්ය. එමෙන්ම තුන් වෙනුව, උන්වහන්සේ අනාවරණය කරන සත්‍යතාවය බලපෑමකින් යුක්තව අනිත් අයට සන්නිවේදනය කිරීමට බලය ලබාදීමත්ය. මේ සියලු කාරණා උදෙසා අපට උන්වහන්සේව අවශ්‍යව තිබෙන සේක.

සේවය තුළ සාර්ථකත්වය පෙනෙන විටදී පවා දේව සේවයේ සැබෑ ලෙස අසාර්ථකවීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ මනුෂ්‍යයාගේ ප්‍රඥාවේ වචන පොළඹවා ඉගැන්වීමට උත්සාහ දැරීමයි. (එනම්, මානව තර්ක ශාස්ත්‍රය, සිත්ගන්නා සුළු කථාව, පෙළඹවීම, කතිකත්වය ආදී කාරණාය.) ශුද්ධාත්මයාණන් වහන්සේ අපට උගන්වා ඇත්තේ මොනවාද .. ? අපට අවශ්‍ය වන්නේ ආත්මයෙන් සහ බලයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේගේ ප්‍රකාශවීමයි.

වර්තමානයේ දේශනා කිරීම අසාර්ථකකමට බලපා ඇති ප්‍රධාන හේතු තුනක් තිබේ. පළමුවෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේ අනාවරණය කරන පණිවිඩයට වඩා වෙනත් පණිවිඩයක් උගන්වනු ලැබීමයි. (මනුෂ්‍යයන් දේශනා කරන්නේ විද්‍යාව, කලාව. සාහිත්‍යය, දර්ශනවාදය, සමාජ විද්‍යාව, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, අත්දැකීම් යන ආදිය මිස ශුද්ධාත්මයාණනන් වහන්සේගේ එළිදරව් කිරීමෙන් ලැබෙන දේව වචනය නොවේ.) දෙවුනව, ආත්මයාණන් වහන්සේ උගන්වනු ලබන පණිවිඩය බයිබලය අධ්‍යයනය කර ස්වභාවික අවබෝධයෙන් ග්‍රහණය කර ගැනීමට උත්සාහ දැරීමයි. එනම් ආත්මයේ ආලෝකය නොමැතිව ක්‍රියා කිරීමයි. තුන්වෙනුව, ආත්මයාණන් වහන්සේ විසින් දෙනු ලබන පණිවිඩය ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලෝක කිරීම යටතේ අධ්‍යයනය කරන ලද සහ ග්‍රහණය කරගනු ලැබූ පණිවිඩය අන්‍යයන්ට දෙනු ලබන්නේ මනුෂ්‍යයාගේ සිත් ඇදගන්නා වූ වචන වලින් මිස ආත්මයේ සහ බලයේ විදහා දැක්වීමෙන් නොවේ. ආත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම මත සම්පූර්ණයෙන්ම රදා පැවතීම අපට අවශ්‍යව තිබේ. කතා කළ යුතු දේ මෙන්ම කථා කළ යුතු ආකාරය ද උන්වහන්සේ අපට ඉගැන්විය යුතුය. එය උන්වහන්සේගේ බලය මෙන්ම පණිවිඩය ද විය යුතුය.

ඔබ නොරුවටෙන්න වගබලාගන්න

පෙරමග දූතයා මෙම කලාපයේ ඉලක්කය වන්නේ සත්‍යතාවය වැළඳගැනීමේ අවශ්‍යතාවය සහ රැවටීමෙන් පරෙස්සම්වීමේ අවශ්‍යතාවයයි. මේවා පැහැදිලිවම මහත් වූ විපාක සහිත තේමාවන් වේ. එක් අතකින් සත්‍යතාවය අපව ආලෝකය වෙතට ගෙන එයි. (යොහාන් 3:21) අපව නිදහස් කරනු ලබයි. (යොහාන් 8:32) අපව පවිත්‍රකර විශුද්ධ කරනු ලබයි. (යොහාන් 17:17) අපව ගැලවීම කරා මගපෙන්වනු ලබයි. (එපීස 1:13) අපගේ ජීවිතවල යහපත් ඵලදරයි. (කොලොස්සි 1:5-6) අපව ආරක්ෂා කරනු ලබයි. (ගීතාවලිය 40:11) අනිත් අතට රැවටීම සහ සත්‍යය යටපත් කිරීම අධ්‍යාත්මික අන්ධකාරයට මගපාදයි. (රෝම 1:18-21) පාපයේ වහල්ව සිටීම (රෝම 1:28-31) දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවය නැතිවී යාම ද්විතිය කථාව 11:16 රෝම 1:28) ආත්මිකව යක්ෂයාගේ කැමැත්තට වහල්වීම (2 තිමෝති 2:25-26) සහ ආත්මික මරණය (රෝම 7:11)

සත්‍යය සහ බොරුව අතර සටන මනුෂ්‍යය වර්ගයා තරම්ම පැරණිය. ඒදන් උයන වැනි ඉතාමත් අනර්ඝ ස්ථානයකදී පවා සාතන් දෙවියන් වහන්සේගේ සත්‍යය සැක කිරීමට සහ අකීකරුවීමට ඒවට පිළියෙල කර, සැලසුම්කර සාර්ථක ලෙස රැවැට්ටුවේය. යහපත හා නපුර දැන ගැනීමේ ගසෙන් කන්න එපා කියා දෙවියන් වහන්සේ ආදම් සහ ඒවාට පැහැදිලි ලෙස අනතුරු අඟවා තිබූ සේක. **"එහෙත් යහපත හා නපුර දැන ගැනීමේ ගසෙන් කන්ට එපාය. වක්නිසාද එයින් කෑ දවසෙහි ඒකාන්තයෙන් නුඹ නසින්නෙහියි යයි කී සේක. "** (උත්පත්ති 2:17) ඊට ප්‍රතිවිරුද්ධ දේ විශ්වාස කිරීමට යක්ෂයා ඒවට රැවටුවේය. **"සර්පයාද නුඹලා අයත්තටම නසින්නේ නැත. වක්නිසාද නුඹලා එයින් කන දවසෙහි නුඹලාගේ ඇස් ඇරෙන බවත්, නුඹලා යහපත හා නපුර දැනගෙන දෙවියන් වහන්සේට සමාන වන බවත් දෙවියන් වහන්සේ දන්නා සේකැයි ස්ත්‍රීට කීවාය."** (උත්පත්ති 3:4-5) (2 කොරින්ති 11:3)

බොරුවේ පියා සහ මහා රැවටිලිකාරයා වන යක්ෂයා (යොහාන් 8:44, එළිදරව් 12:9) නොකඩවාම සත්‍යයට විරුද්ධ වෙවින් **දෙවියන් වහන්සේගේ සෙනඟව කාර්‍යා** වලින් නොමඟ යැවමට සහ අඩපණ කිරීමට උත්සාහ කරන බැවින් දෙවියන් වහන්සේගේ සත්‍යයට එරෙහි සටන අද දක්වාම ඇවිලී යයි. සාතන්ගෙන්, අන්ධකාර සේනාවන්ගෙන්, බොරු ගුරුවරුන්ගෙන් සහ බොරු

රිවි කාමයිකල් විසිනි.

අනාගතවකතෘවරුන්ගෙන්, ලෝකයෙන්, පැමිණෙන රැවටිලිකාර පාපවලින් රැවටිලිකාර වස්තුවෙන්, අපගේම හදවත් තුලින් වුවත් යන සෑම අංශයකින්ම රැවටිලාකාරකම අප වෙතට පැමිණෙන්. එමෙන්ම මෙම සටන අවසාන කාලයේ දී තවත් වර්ධනය වන බව යේසුස් වහන්සේ අපට අනතුරු ඇඟවූ සේක. **"නොයෙක් බොරු අනාගතවකතෘවරු නිසාට බොහෝ දෙනෙකු මුලාකර්නේය. (මතෙව් 24:11) පාවුල්තුමාත් ඒ හා සමානවම ලියා ඇත. "නමුත් නපුරු මනුෂ්‍යයොත්, රැවටිලිකාරයොත්, වරවමින්ද, රැවටෙමින්ද වඩා වඩා නරක්වන්නේය."** (2 තිමෝති 3:13) ඔහු මෙලෙසින් ද අනතුරු ඇගෙව්වේය. "එහෙත් පසු කාලවලදී සමහරු මුළා කරවන ආත්මයන්ද, යක්ෂයන්ගේ ගුරුකම් ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන් වහන්සේ පැහැදිලි ලෙස කියන සේක. (1 තිමෝති 4:1) සාතන් ඔහුගේ කාලය කෙටි බව දැන සිටියි. එම නිසා ප්‍රහාරය අනුකම්පා විරහිතව (කුරිරුව) සහ අඛණ්ඩව එල්ල කරනු ලබයි.

3 පිටුවට

2 පිටුවෙන්

ඔබ නොරැවටෙන්න වගබලාගන්න...

අප ජීවත්වන්නා වූ මේ දවස්වල දී දෙවියන් වහන්සේගේ සත්‍යය ප්‍රතික්ෂේප කරමින් සහ මර්ධනයට ලක් කරමින් අසත්‍යය සහ රැවටීම ව්‍යාප්ත වී තිබෙන බව ඔබ අවධානය යොමු කරනු ලැබුවේද ..? යෙරමියා, යොසායා, හොෂෙයා මේ වර්තමාන තත්ත්වය පිළිබඳව ප්‍රකාශ කර තිබෙන දේ විස්තර කර ඇත. **"එබැවින් මොවුහු තමුන්ගේ දෙවි වූ ස්වාමීන් වහන්සේගේ හඬට කන්දුන්නා වූ දැනමුතුකම පිළිනොගත්තා වූ ජාතියය. ඔවුන්ගේ මුඛයෙන් සැබෑව නැතිවී සිදී ගියා යයි ඔවුන්ට කියාපන්න."** (යෙරමියා 7:28) **"යුක්තිය පස්සට හරවා දමනු ලැබීය. ධර්මිෂ්ඨකමද දුරින් තිබේ. මක්නිසාද සැබෑකම වීදියේ වැටුණේය. අවංකකමට ඇතුල්වෙන්ට බැරිය."** (යෙසායා 59:14) **"ඊශ්‍රායෙල් පුත්‍රයෙනි, ස්වාමීන් වහන්සේගේ වචනය අසාපල්ලා. මක්නිසාද සැබෑකමවත් කරුණාවවත්, දෙවියන් වහන්සේ අදිනගැනීමවත් දේශයේ නැති හෙයින් දේශයේ වැසියන් සමඟ ස්වාමීන් වහන්සේට පැවිණිල්ලක් තිබේ."** (හොෂෙයා 4:1) රෝමවරුන්ට එය පැහැදිලි කර ඇත්තේ කෙසේද ? **"මක්නිසාද සත්‍යය අධර්මිෂ්ඨකමින් වළක්වන්නා වූ මනුෂ්‍යයන්ගේ සියලු අභක්තියටද, අධර්මිෂ්ඨකමටද විරුද්ධව දෙවියන් වහන්සේගේ උදහස ස්වර්ගයෙන් එළිදැක්වී තිබේ."** (රෝම 1:18) "එසේ කළේ ඔවුන් දෙවියන් වහන්සේගේ සත්‍යය බොරුවකට මාරුකර මැවුම්කාරයාණන් වහන්සේට නොව මැවිල්ලට නමස්කාර කරමින් මෙහෙ කළ නිසාය. උන්වහන්සේ සදාකල්හිම ප්‍රශංසනීයව සිටින සේක. ආමේන් ... !

සත්‍යතාවය වැළඳගන්න.

අපි මුහුණදෙන ආත්මික සටනේ ආලෝකමත්වීම තුළ පාවුල්තුමා අපට අවවාද කරන්නේ ආත්මික යුද්ධායුධ පැළඳගන්නා ලෙසයි. **"යක්ෂයාගේ උපායවලට විරුද්ධව සිටින්ට නුඹලාට පුළුවන් වන පිණිස දෙවියන් වහන්සේගේ සියලු යුද්ධායුධ පැළඳගනිල්ලා"** (එපීස 6:11) එහි සියලු දේවලට ප්‍රථමයෙන් තිබෙන ආයුධය සැබෑකමයි. එබැවින් නුඹලාගේ ඉගටි සැබෑකම නැමති පටියෙන් බැඳගෙන ... (එපීස 6:14) සත්‍යතාවය සැබවින්ම අත්‍යාවශ්‍යවේ. ගීතිකාකරුවා සත්‍යතාවය උදෙසා අපගේ කැපවීම අළුත් කරනු ලැබිය යුතු බව මෙසේ පෙන්වාදෙනු ලබයි. **"විශ්වාසකමේ මාර්ගය තෝරා ගතිමි. ඔබගේ විනිශ්චයන් මා ඉදිරියෙහි තබා ගතිමි."** (ගීතාවලිය 119:30) සත්‍යතාවය නැමති ඉඟපටිය බැඳගනිමු. සත්‍යය වැළඳගනිමු. සත්‍යයට කීකරුවෙමින් ඒ තුළ ගමන් කරමු. ශුද්ධාත්මයාණන් වහන්සේ සත්‍යතාවයේ ආත්මයාණන් වහන්සේ ලෙසත් උන්වහන්සේ මුළු සත්‍යය කරා අපට මගපෙන්වන බවත් දකිමු. (යොහාන් 16:13) දෙවියන් වහන්සේගේ වචනයට අපගේ ජීවිත නැවුම් ලෙස කැප කරමු. දෙවියන් වහන්සේගේ වචනය සත්‍යයතාවයයි. (යොහාන් 17:17) අපේ දෙවියන් වහන්සේගේ මුලු සත්‍යය වෙත අපගේ දෑස් සහ හදවත් රඳවා තබා ගනිමු. (නික්මයාම 34:6) සදාකල් පවතින්නා වූ සත්‍යතාවය අයිති කාටද ... ? (ගීතාවලිය 1172) එමෙන්ම අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ **"මාර්ගයත්, සැබෑවත්, ජීවනයත් වන සේක."** (යොහාන් 14:6, 1:14 එපීස 4:21) අන්තිම දවස්වලදී උන්වහන්සේ අපට අනතුරු අඟවා තිබෙන කාරණාවලට සැලකිල්ලෙන් යුතුව අවධානය යොමු කරමු. **"උන්වහන්සේ කියන සේක් මුළා නොවෙන්ට බලාගනිල්ලා. මක්නිසාද මාගේ නාමයෙන් බොහෝ දෙනෙක් ඇවිත් 'ඒ මමය කියාත්, කාලය ළඟය කියාත් කියන්නෝය. ඔවුන් පස්සේ නොයල්ලා."** (ලූක් 21:8)

"ඔබගේ ඵලදායී, සැබෑකමත් එවුව මැනව. ඒවා මා ගෙනයෙන්වා. ඒවා ඔබගේ ශුද්ධ වූ කන්දටත්, ඔබගේ වාසස්ථානවලටත් මා පවුණුවන්වා" (ගීතාවලිය 43:3)

ක්‍රිස්තුස් වහන්සේ යනු සියල්ලයි

අන්තිම දවස්වලදී ව්‍යාජ ඉගැන්වීම් වලින් ආරක්ෂාවීමට පැහැදිලිවම අපට අනතුරු අගවා තිබේ. උදාහරණ වශයෙන් පාවුල්තුමා මේ ආකාරයෙන් ලියා ඇත. **"එහෙත් පසු කාලවලදී සමහරු මුලාකරවන ආත්මයන් ද යක්ෂයන්ගේ ග්‍රාහකව් ද සලකා අැදහිල්ලෙන් අහක්ව යනවා අැතැයි ආත්මයාණන් වහන්සේ පැහැදිලි ලෙස කියන සේක."** (1 තිමෝති 4:1) සහ **"නුවුත් නපුරු මනුෂ්‍යයොත්, රැවටිලිකාරයොත්, රවටමින්ද රැවටෙමින්ද වඩ වඩා නරක් වන්නෝය."** (2 තිමෝති 3:13) අපෝස්තුළු යොහාන් අපට පැහැදිලි කර තිබෙන්නේ **මෙසේය. "ප්‍රේමවන්තයෙනි, බොහෝ බොරු ප්‍රොපේතවරු ලෝකයට පැවිණ සිටින බැවින් සියලු ආත්ම විශ්වාස නොකොට ඒ ආත්ම දෙවියන් වහන්සේගෙන්දැයි පරීක්ෂා කරපල්ලා."** (1යොහාන් 4:1) අපෝස්තුළු ප්‍රේත්‍රුස් මෙසේ සඳහන් කරයි. **"එබැවින් ප්‍රේමවන්තයෙනි, නුඹලා වේ දේවල් කලින් දැනගෙන සිටින බැවින් දුෂ්ඨයන්ගේ මුලාවෙන් අැදීගෙස් නුඹලාගේම ස්ථීරභාවයෙන් නොවැටෙන පිණිස පරෙස්සම්වෙයල්ලා."** (2 ප්‍රේත්‍රුස් 3:17)

සත්‍යතාවයේ ඕනෑම විකෘතිවීමක් පිළිබඳව අපි විමසිලිමත් විය යුතුය. ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලිකත්වය සහ ක්‍රියාවන් පිළිබඳ ව්‍යාජ ඉගැන්වීම් ගැන විශේෂයෙන් විමසිලිමත් විය යුතුය. දෙවියන් වහන්සේගේ සදාකාලික සැලැස්මේ සහ අභිප්‍රායේ කේන්ද්‍රස්ථානය උන්වහන්සේය. (එපීස 3:11) උන්වහන්සේ සියලු ආකාරයේ රැවටීම්වල සහ විකෘති කිරීම්වල ඉලක්කය වී සිටින සේක. ප්‍රහාරයට ලක් කර ඇති උන්වහන්සේගේ සමහර සත්‍යතාවයන් අතර උන්වහන්සේගේ කන්‍යා උපත උන්වහන්සේගේ දේවත්වය, දෙවියන් වහන්සේගේ පුත්‍රයා ලෙස උන්වහන්සේගේ අද්විතීය ස්ථානය, ගැලවීමේ එකම මාර්ගය බවට උන්වහන්සේගේ ප්‍රකාශය, නැවත පැමිණීමේ පොරොන්දුව අයත්ව තිබේ.

ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලභාවය සහ ක්‍රියාව ගැන ව්‍යාජ ඉගැන්වීම් නොකඩවා අපට බලාපොරොත්තු වන්නට සිදුවේ. ඉදිරි දිනවලදී එය තවත් වර්ධනය වන්නේය. උන්වහන්සේට විරුද්ධ ප්‍රහාරයන් දිගු කාලීනව පවතින්නේය. උදාහරණයක් වශයෙන් අපෝස්තුළු පාවුල් කොරින්තිවරුන්ට යවනු ලැබූ ලිපියෙහි ප්‍රකාශ කරන්නේ රැවටිලිකාර සේවකයන්ගේ දේශනා කරුණුකොටගෙන මනුෂ්‍යයාව ක්‍රිස්තුස් වහන්සේගෙන් ඈතට ගෙන යනු ලබන බවයි. **"නුවුත් සර්පයා තමගේ ප්‍රයෝගයෙන් ඒව රැවටුවාක්මෙන් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි පවතින අවංකකමෙන්ද, පිරිසිදුකමෙන්ද යම් විධියකින් නුඹලා වෙන්කොට නුඹලාගේ හිත් දූෂ්‍ය කරනු ලැබේදෝ කියා භය වෙමි. මක්නිසාද එන්නා වූ තැනැත්තේ අප දේශනා නොකළ වෙන යේසුස් කෙනෙකු ගැන දේශනා කෙරේ නම්, නොහොත් නුඹලා නොලැබූ වෙන ආත්මයක්වත් නුඹලා පිළි නොගත් වෙන සුභාරංචියක්වත් නුඹලා ඔහුගෙන් පිළිගන්නහු නම් ඔහු ගැන ඉවසීම හොඳය."** (2 කොරින්ති 11 : 3-4) අපෝස්තුළු ප්‍රේත්‍රුස් බොරු ගුරුවරු ගැන අනතුරු අගවයි. **"නුවුත් සෙනඟ අතරේ බොහෝ ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශක ධර්මඡේද බහසින් උපදවමින්ද තමුන්ව විලෙටගත් ආචාරීන්වහන්සේව එපා කරමින් ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නා වූ බොහෝ ගුරුවරු නුඹලා අතරෙත් වන්නෝය."** (2 ප්‍රේත්‍රුස් 2:1) අවසාන දවස්වලදී සමච්චල් කරන්නන් ගැනද ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීමේ පොරොන්දුව පිළිබඳව ප්‍රශ්න කරන්නන් ගැනද අනතුරු අගවයි. (2 ප්‍රේත්‍රුස් 3:3-4) අපෝස්තුළු යොහාන් අනතුරු අගවන්නේ යෙසුස් වහන්සේ මාංශයෙන් යුක්තව පැමිණි බව විශ්වාස නොකරන අය තුළ අන්ත ක්‍රිස්තුස්ගේ ආත්මය ක්‍රියාකරන්නේය කියාය. (1 යොහාන් 4:3, 2 යොහාන් 1:7) එමෙන්ම යේසුස් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ නොවන බව ප්‍රකාශ කරන්නන්ද (1 යොහාන් 2:22) උන්වහන්සේගේ ඉගැන්වීම තුළ නොපවතින අයද සිටිති. (2 යොහාන් 1:9)

ඒ ආකාරයෙන්ම අවධානයට ලක්නොවී රිංගා යන ව්‍යාජ ගුරුවරුන්ගේ යතාර්ථය සටහන් කර ඇත. **"මක්නිසාද පුරාණ කාලයේ දී මේ දඬුවමට නියමකොට තැබුවාවූද, අභක්තිකවූද, අපගේ දෙවියන් වහන්සේගේ කරුණාව සල්ලාලකමට හරවාගන්නාවූද, අපගේ එකම අධිපති වූ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව එපා කරන්නාවූද මනුෂ්‍යයන් වගයක් රහසින් ඇතුල්වී සිටිති."** (යුදස් 1:4) ඔහු ඇදහිලිවන්තයාගේ අවශ්‍යතාවයද අවධාරණය කරයි. **"ප්‍රේමවන්තයෙනි, අපේ පොදු ගැලවීම ගැන නුඹලාට ලියා එවන්ට වුව උත්සාහය දරන විට එක වරක්ම ශුද්ධවන්තයන්ට හර දුන් අදහිල්ල උදෙසා උත්තර ආකාරයෙන් පොර අල්ලන ලෙස අවවාද කරවින් නුඹලාට ලියා එවන්ට වට ඕනෑවිය."** (යුදස් 1:3) ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව පදනම් වී ඇති සත්‍යයන් විකෘති කරන සහ ප්‍රතික්ෂේප කරන පුද්ගලයන්ගේ යතාර්ථයට අපි මුහුණ දෙන විට අද අප ඉදිරියේ ඇති අභියෝගය මෙයයි. ශුද්ධ ලියවිල්ලේ උගන්වන දෙයට සහ ක්‍රිස්තුස් වහන්සේ සම්බන්ධයෙන් සභාව යුග ගණනාවක් පුරා විශ්වාසවන්තව රැකගෙන අපට භාර දුන් සත්‍යයන්ට අප විශ්වාසවන්තව සිටිය යුතුය.

රිව් කාර්මයිකල් විසිනි.

ක්‍රිස්තුස් වහන්සේ යනු සියල්ලයි

බොහෝ ආගම් සහ පුද්ගලයන් යේසුස් වහන්සේ යහපත් ගුරුවරයෙකු, යහපත් අනාගතවකතෘ කෙනෙකු සහ යහපත් පුද්ගලයෙකු ලෙස සැලකුවද උන්වහන්සේ අන් සියල්ලන් අභිබවා යන අන් සෑම නාමයකට වඩා උසස් නාමයක් ඇත්තා වූ තැනැත්තා වහන්සේ බව පිළිගන්නේ නැත. අනුගාමිකයන් උදෙසා සියල්ල වැය කළා වූ තැනැත්වහන්සේ බව පිළිගන්නේ නැත. අනුගාමිකයන් උදෙසා සියල්ල වැය කළා වූ තැනැත් වහන්සේ බව පිළිගන්නේ නැත. අනිත් අතට බයිබලයේ මෙසේ උගන්වන්නේය. **"එහි ග්‍රීකයෙක්වත්, යුදෙව්වෙක්වත්, චර්මච්ඡේදිතයෙක්වත්, අධර්මච්ඡේදිතයෙක්වත්, විලේච්ඡයෙක්වත්, ස්කිතියෙක්වත්, දාසයෙක්වත්, නිර්දාසයෙක්වත් සිටිනවා නොව, ක්‍රිස්තුස් වහන්සේ සියල්ලව, සියල්ලන් තුල සිටින සේක."** (කොලොස්සි 3:11) **"වම අල්ලෑ සහ ඩවේගය පළවුවෙනියා සහ අන්තිමයාය, පටන් ගැන්ව සහ කෙළවරය. "** (එළිදරව් 22:13) **දෙවියන් වහන්සේ, යේසුස් වහන්සේව මළවුන්ගෙන් නැගිටුවා** සියලු නාමවලට වඩා උන්වහන්සේව උසස්කොට තැබූ **සේක. "උන්වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ තුළ ඉෂ්ඨ කළා වූ ස්වකීය පරාක්‍රමයේ ශක්තිමත්කමේ ඒ ක්‍රියා කිරීමෙ ප්‍රකාරයට ක්‍රිස්තුස් වහන්සේව මළවුන්ගෙන් නැගිටුවා සියලු අධිපතිකමටත්, බලයටත්, පරාක්‍රමයටත් , ස්වාමිකමටත්, මේ ලෝකයෙහි පමණක් නොව පරලෝකයෙහිත් සඳහන් කරන ලද සියලු නම් වලටත් වඩා උසස්කොට ස්වර්ග ය ස්ථානවල තමන් දකුණු පැත්තෙහි හිඳුවා සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළ සේක."** (එපීස 1:20-22) ස්වර්ගයෙත්, පොළොවේත් සියලු බලය උන්වහන්සේට ලබාදුන් සේක.

(මතෙව් 28:18) සියලු දේ උන්වහන්සේට යටත්කොට තැබූ සේක. (එපීස 1:22) උන්වහන්සේ පමණක්ම ස්වාමීන් වහන්සේ වන අතර උන්වහන්සේ තුලින් සියල්ල පැමිණේ උන්වහන්සේ තුලින් අපි ජීවත්වන්නෙමු. (1 කොරින්ති 8:6) උන්වහන්සේ සියලු දේවල උරුමක්කාරයාය. දෙවියන් වහන්සේගේ මහිමයේ දීප්තිය සහ යේසුස් වහන්සේ තුළ දෙවියන් වහන්සේගේ ස්වභාවය සැබෑ ලෙස නිරූපණය වන අතර උන්වහන්සේ සියල්ල දරා සිටින සේක. **"මේ දවස්වල කෙළවර දී තමන් වහන්සේගේ පුත්‍රයාණන් ලවා**

4 පිටුවට

3 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ යනු සියල්ලයි...

අපට කථා කෙරෙවූ සේක. උන්වහන්සේව සියල්ලට උරුමක්කාරයා කළ සේක. උන්වහන්සේ කරුණාකොටගෙන ලෝකවල් සෑදූ සේක. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ වහන්කත්වයේ ප්‍රභවය ද උන්වහන්සේගේ දේවත්වයේ ස්වභාවය ද වන සේක. තමන්ගේ බලප්‍රතාකුවයේ වචනයෙන් සියල්ල දරමින් පව් ගැන පවිත්‍රවීමක් කළ පසු උසස්ථානවල මහෝත්තමයාණන් වහන්සේගේ දකුණු පැත්තේ හිඳගත් සේක." (හෙබ්‍රෙව් 1:2-3) ***"එක්නිසාද සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බල ප්‍රාකුම වේවා, සර්වඝවල සහ පොළොවෙහිත් ඇති පෙනෙන්නා වූ දේවල් ද, නොපෙනෙන්නා වූ දේවල් ද යන සියල්ල උන්වහන්සේ තුළ, වචන ලද්දේය. සියලු දේ උන්වහන්සේ කරුණාකොටගෙන ද, උන්වහන්සේ උදෙසා ද වවා තිබේ. උන්වහන්සේ සියල්ලටම පළමුවෙන් සිටින සේක. සියල්ල ද උන්වහන්සේ තුළ පවතින්නේය."*** (කොලොස්සි 1:16-17)

උන්වහන්සේ දෙවියන් වහන්සේගේ වචනය වන අතර උන්වහන්සේ දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨතම පණිවිඩකරුවා සහ ලෝකයට පැමිණියා වූ පණිවිඩයයි. (යොහාන් 1:1, හෙබ්‍රෙව් 1:2) වැදගත් වූ ප්‍රධාන කාරණය නම්, ***"ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිවි. එනම් ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස් වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ නැගිට්ටත් කරනු ලැබූ බවත්, ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගිටුවනු ලැබූ බවත්...,"*** (1 කොරින්ති 15 : 3-4) උන්වහන්සේ, දෙවියන් වහන්සේගේ ශුද්ධ තැනැත්තා සහ උන්වහන්සේ ජීවනයේ වචනයයි. (යොහාන් 6:68-69) උන්වහන්සේ ජීවනයේ ආහාරයයි. (යොහාන් 6:35) ජීවනදායක වතුර උල්පතයි. (යොහාන් 4:14) සියලු ආත්මික ආශීර්වාදවල උල්පතයි. (එපීස 1:3-4) ප්‍රඥාවේ සහ දැනගැන්මේ සියලු වස්තුව උන්වහන්සේ තුළ නිධානකර තිබේ. "ඒ තැනැන්වහන්සේ තුළ ප්‍රඥාවෙත්, දැනගැන්මෙත් සියලු වස්තු නිදානකර ඇත්තේමය." (කොලොස්සි 2:3)

උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝය.

යේසුස් වහන්සේ දෙවියන් වහනසේගේ පුත්‍රයාණන් බවට සත්‍ය වූ සාක්ෂිශුද්ධ ලියවිල්ලේ පිරී පවතියි. යේසුස් වහන්සේ උන්වහන්සේගේම ජීවිතයෙන් එම සාක්ෂිවලට ඇතුළත් වූ සේක. (මාර්ක 14 : 61-62) යේසුස් වහන්සේගේ බෞත්සිමයේ දී සහ අන්වෙසක් වීමේදී පියාණන් වහන්සේම සාක්ෂි දැරූ සේක. ***"තවද මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි අහසෙන් හඬක් විය."*** ***(මතෙව් 3:17) "ඔහු කතාකාරිද්දීම දීප්තිමත් වලාපටලයක් ඔවුන් වත්තෙහි පැහැර තිබුණේය. බලව. මේ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මොහු කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි. මොහුට අහුව්කන්දෙවියයි වලාපටලයෙන් හඬක් විය."*** (මතෙව් 17:5) පටන් ගැන්මේදී යේසුස් වහන්සේ, දෙවියන් වහන්සේ සමඟ සිටි සේක. (යොහාන් 1:1) ස්වර්ගයෙන් පොළොවට ආසේක. (යොහාන් 6:38) මාංශවත්වී අප අතරේ වාසය කළ සේක. (යොහාන් 1:14) ක්‍රිස්තුස් වහන්සේගේ මනුෂ්‍යත්වය සම්බන්ධයෙන් උන්වහන්සේ කන්‍යාවක් තුලින් උපත ලැබීම කිතුණු නායකයන් යැයි කියාගන්නා බොහෝ දෙනෙක් ප්‍රතික්ෂේප කරති. කෙසේ වෙතත් උන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය කරුණුකොටගෙන කන්‍යාවියක්ව සිටි මරියා තුළ පිළිසිඳගත් බවත් ශුද්ධ ලියවිල්ල ඉතා පැහැදිලිව පෙන්වා දී ඇත.. (ලුක් 1:35, මතෙව් 1:23)

යේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා යන කාරණය උන්වහන්සේ දේවත්වය සම්බන්ධයෙන් ගැඹුරු ඇඟවීම් ඇතුළත්ව ඇත. උදාහරණයක් වශයෙන් යුදෙව් නායකයන් දැන සිටියේ දෙවියන් වහන්සේව උන්වහන්සේගේ පියාණන් ලෙස හඳුන්වාගත් බවයි. ***"මවද, පියාණන් වහන්සේ ද එක තැනැත්තා යයි කී සේක."*** (යොහාන් 10:30) යේසුස් වහන්සේ තමන් වහන්සේට පියාණන් වහන්සේට සමාන කරගත් බවයි. ***"එබැවින් උන්වහන්සේ සබත් දවස කඩකළා පමණක් නොව, දෙවියන් වහන්සේ තමන්ගේම පියාණන් යැයි කියමින් තමන් දෙවියන් වහන්සේ හා සමාන කරගත් නිසා යුදෙව්වරු උන්වහන්සේ මරන්ට වඩ වඩා සෙවූවෝය."*** (යොහාන් 5:18) ***"යුදෙව්වරු උන්වහන්සේට උත්තර දෙමින් අප නුඹට ගල්ගැසන්නේ යහපත් ක්‍රියාවක් නිසා නොව දේව අපහාසය නිසායයි කීවෝය."*** (යොහාන් 10:33) නමුත් සැබවින්ම ශුද්ධ ලියවිල්ල ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වය තහවුරු කරයි. ***"පටන් ගැන්මේදී වාකයාණෝ සිටි සේක. වාකයාණෝ දෙවියන් වහන්සේ හා සමඟ සිටි සේක. වාකයාණෝ දෙවියන් වහන්සේව සිටි සේක."*** (යොහාන් 1:1) යේසුස් වහන්සේ ඔවුන්ට මෙසේ කී සේක. ***"යේසුස් වහන්සේ ඔවුන්ට කථාකොට සැබෑවක් සැබෑවක් නුඹලාට කියමි. ආබ්‍රහම් උපදින්ට පළමුවෙන් මම සිටිමියි කී සේක."*** (යොහාන් 8:58) ***"මේ සියල්ල සිද්ධවූයේ බලව කන්‍යාව ගර්භණීව පුත්‍රයෙකු වදන්නීය. උන්වහන්සේට එම්මානුවෙල් යන නාමය තබනවා ඇත කියා ස්වාමීන් වහන්සේ අනාගතවකතෘතුමා කියෙවූ කීම සම්පූර්ණවන පිණිසය. ඒ නාමයේ අර්ථය නම් දෙවියන් වහන්සේ අප සමඟය යනුයි."*** (මතෙව් 1:22-23) ***"තෝමස් උත්තර දෙමින් මාගේ ස්වාමීනි, මාගේ දෙවියනියි උන්වහන්සේට කීවේය."*** (යොහාන් 20:28) ***"එක්නිසාද උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය."*** (කොලොස්සි 2:9) ***"නුඹත් පුත්‍රයා ගැන කතාකොට, දෙවියන් වහන්ස, ඔබගේ සිංහාසනය සදාකාලේටම පවතින්නේය. ඔබගේ රාජ්‍යයේ ජයකොන්තය යුක්තියේ ජයකොන්තයක්ය."*** (හෙබ්‍රෙව් 1:8) බොරු ඉගැන්වීම්වල සලකුණක් වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වය ප්‍රතික්ෂේප කිරීම හෝ විකෘති කිරීමයි.

උන්වහන්සේ ගැලවීමේ එකම මාර්ගයයි

වර්තමානයේ ඇති ලොකුම රැවටිල්ලක් වන්නේ යේසුස් වහන්සේ දෙවියන් වහන්සේ වෙතට යාමට ඇති එකම මාර්ගය නොව බොහෝ මාර්ගවලින් එකක් බව පැවසීමයි. මෙම වරද පදනම්වී ඇත්තේ සදාකාල ජීවනය දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් තුලින් පමණක් බව අවධාරණයෙන් උගන්වන ශුද්ධ ලියවිල්ල ප්‍රතික්ෂේප කිරීමයි. ***"ඒ සාක්ෂිය නම් දෙවියන් වහන්සේ අපට සදාකාල ජීවනය දුන් බවය. ඒ ජීවිතයද තමන් පුත්‍රයාණන් තුළ තිබේ. පුත්‍රයාණන් වහන්සේ ඇත්තාට ඒ ජීවනය ඇත. දෙවියන් වහන්සේගේ පුත්‍රයා නැත්තාට ඒ ජීවනය නැත."*** (1 යොහාන් 5:11 -12) යේසුස් වහන්සේ, ගැනම මෙසේ පැවසූ සේක. ***"යේසුස් වහන්සේ ඔහුට කියනසේක්, මාර්ගයද, සැබෑවද, ජීවනයද මවය. මා කරුණාකොටගෙන මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත."*** (යොහාන් 14:6) ගැලවීම වෙන කිසිවෙක් තුළ නැත්තේය. (ක්‍රියා 4:12)

යේසුස් වහන්සේ තුලින් හැර දෙවියන් වහන්සේ වෙතට පැමිණීමට වෙනත් මාර්ග ඇති බව පවසන ව්‍යාජ ඉගැන්වීම් පදනම්වී ඇත්තේ දෙවියන් වහන්සේගේ ශුද්ධකම, පාපයේ බරපතලකම සහ සමාවදීමේ ක්‍රම පිළිබඳව පැහිදිලි අවබෝධයක් නොමැතිකම මතය. දෙවියන් වහන්සේ සැබෑවටම ශුද්ධය. එමෙන්ම මනුෂ්‍යයාගේ පාපය දෙවියන් වහන්සේගෙන් ඔහුව වෙන්කරනු ලබයි. (යෙසායා 59:2) එමෙන්ම අවසානයේ දී මරණය කරා ගෙන යනු ලබයි. (රෝම 6:23) දෙවියන් වහන්සේ යුක්ති සහගත බැවින් උන්වහන්සේට පාපය නොසලකා හැරිය නොහැකිය. කෙසේ වෙතත් උන්වහන්සේ ඉතා අගනා මාර්ගයක් සපයාදී තිබේ. එනම් පාපය උදෙසා වන්දිය ගෙවා සමාව ලබාදෙන පිණිස ලේ වගුරවමින් උන්වහන්සේගේ නිදොස් ජීවිතය පූජා කිරීමෙනි. මනුෂ්‍යයාගේ පාපයට සමාවදීමේ හැකියාව සහ ප්‍රමාණවත් බව තිබෙන්නේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන දෙවියන් වහන්සේගේ අනගි බැටළු පැවාගේ ලේ සහ ජීවිතයට පමණි. බොහෝ මනුෂ්‍යයන් වැරදි ලෙස සිතන්නේ තමන්ගේම ධර්මිෂ්ඨකමෙන් සහ යහපත් ක්‍රියාවලින් ගැලවීම ලබාගත හැකි බවයි. නමුත් මනුෂ්‍යයන් කොපමණ හොඳ මනුෂ්‍යයන් වුවත් ශුද්ධ වූ දෙවියන් වහන්සේගේ ආලෝකය තුළ තමන්වම ගලවා ගැනීමට ඔවුන්ට කිසිදාක යහපත් විය නොහැකිය. සමාව ලබාගෙන ගැලවීම සහ සදාකාල ජීවනය හිමිකර ගැනීමටත් පාපය සමඟ කටයුතු කළ යුතුය. මෙය කළ හැකි වන්නේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුලින් පමණි. අප කෙරෙහි තිබෙන දෙවියන් වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ කරනු ලැබුවේ දෙවියන් වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් කරුණුකොටගෙන අප ජීවත්වෙන පිණිස උන්වහන්සේ ලෝකයට එවූ කාරණයෙන්ය. ප්‍රේමය මේය, එනම්, අප දෙවියන් වහන්සේට ප්‍රේමකළා නොව, උන්වහන්සේ අපට ප්‍රේමකොට අපේ පව් උදෙසා ශාන්තිකර ප්‍රජාව වන පිණිස තමන්ගේ පුත්‍රයා එවූ බවය. (1 යොහාන් 4:9-10) යේසුස් වහන්සේ, දෙවියන් වහ්නසේ සහ මනුෂ්‍යයා අතර මැදහත්කරුවාණන් වන සේක. (1 තිමෝති 2:5) යේසුස් වහන්සේගේ ලේ තුලින් මිස දෙවියන් වහන්සේ වෙතට පැමිණීමට වෙන මාර්ගයක් නැත.

උන්වහන්සේ නැවත එන සේක.

යේසුස් වහන්සේ නැවත පැමිණෙන බව අවතක්සේරු කරන හෝ ප්‍රතික්ෂේප කරන අය අද දින ව්‍යාජ ඉගැන්වීම් කරති. යේසුස් වහන්සේ මහත් බලයෙන් සහ තේජසින් යුතුව නැවත පැමිණෙන සේක. (මාර්ක් 13:26, ලුක් 9:26) ***"බලාපල්ලා, උන්වහන්සේ වළාකුළුවලින් එන සේක. සියළු ඇස් ද උන්වහන්සේට ඇන්න අයද උන්වහන්සේව දකින්නේය. පොළොවේ සියලු ගෝත්‍රද උන්වහන්සේ නිසා වැලපෙන්නේය. එසේය. ආමේන් ... !"*** (එළිදරව් 1:7) ***"කුඩක් හෙයින් ද ස්වාවිවූ යේසුස් වහ්නසේ තමන්ගේ ප්‍රාකුමයේ දූතයන් සමඟ අව්ලෙන්නා වූ ගින්නෙන් යුක්තව ස්වර්ගයෙන් එබැහැවිවී දෙවියන් වහන්සේ නාඳුනන්නන්ටත් අපේ ස්වාමි වූ යේසුස් වහන්සේගේ ශුභාරංචියට කීකරු නොවන්නන්ටත් ප්‍රතිවල දෙන කළ නුඹලාට දුක්දෙන්නන්ට දුකද, දුක්විඳින නුඹලාට අප සමඟ සහනය ද දීම දෙවියන් වහන්සේ ඉදිරියෙහි ධර්මිෂ්ඨ වූ කාරණයක්ය."*** (2 තෙසලෝනික 6:6-8)

ඒ දවසේදී ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියේ සියලුදේ ප්‍රකාශවන්නේය. ***" එක්නිසාද එකිනෙකා තම තමාගේ ශරීරයේ දී කළා වූ දේවල වල ඒ දේ යහපත් වුවත්, අයහපත් වුවත් කළ දේවල හැටියට ලබන පිණිස අප සියල්ලෝම ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චාසනය ඉදිරියෙහි ප්‍රකාශවෙන්ට ඕනෑය."*** (2 කොරින්ති 5:10) උන්වහන්සේව ප්‍රතික්ෂේප කරන සහ උන්වහන්සේගේ ඉගැන්වීම් නොලැබෙන ඕනෑම කෙනෙක්ව උන්වහන්සේගේ වචනයෙන් විනිශ්චය කරනු ලැබේ. (යොහාන් 12:48) උන්වහන්සේව ස්වාමීන් වහන්සේ ලෙස හඳුණන අපට ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය දැනුම ඇතිකරන සේක. ***"සිහියෙන් යුක්තවද ධර්මිෂ්ඨලෙසද, භක්තිවන්ත ලෙසද වේ ලෝකයෙහි ජීවත්වන පිණිස ඒ කරුණාව අප දැනුවැතිකරන්නේය."*** (තීතස් 2:13) පැමිණෙන්නා වූ උදහසින් අපව ගලවාගන්නා සේක. (1 තෙසලෝනික 1:10) ඒ දවසේ දී උන්වහන්සේ තම ශුද්ධවන්තයන් තුළ මහිමයට පත්වනු ඇත. විශ්වාස කළ අය අතර විශ්මයට පත්වනු ඇත. (2 තෙසලෝනික 1:9)

ක්‍රිස්තුස් වහන්සේ මත ඔබගේ අවධානය රඳවාගන්න

ක්‍රිස්තුස් වහන්සේ සම්බන්ධයෙන් අද ලෝකයේ සහ සභාව තුළ බොහෝ ව්‍යාජ ඉගැන්වීම් තිබුණත් ***"යේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඊයේත් අදත්, සදාකාලයටත් එකාකාරවය".*** (හෙබ්‍රෙව් 13:8) ශුද්ධලියවිල්ලේ සාක්ෂි දරණ සියලු දේ එය වේ. උන්වහන්සේ, දෙවියන් වහන්සේගේ දිව්‍යමය පුත්‍රයාණෝය. උන්වහන්සේ ගැලවීමේ එකම මාර්ගය වන අතර රජුන්ගේ රජතුමා සහ ස්වාමීන්ගේ ස්වාමිතුමා ලෙස නැවත පැමිණේ. (එළිදරව් 19:11-16) උන්වහන්සේගේ පුද්ගලිකත්වය සහ ක්‍රියාවන් හීන කරන ඕනෑම අයෙකුගේ හෝ ඕනෑම ආකාරයක ඉගැන්වීම් පිළිබඳව ප්‍රවේසම් වෙන්න.

"යේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්, කිසිවෙක් නුඹලා මුලා නොකරන ලෙස බලාගනිල්ලා" (මතෙව් 24:4)

බොරු ගුරුවරුන්ගෙන් සහ බොරු අනාගතවක්තෘවරුන්ගෙන් ප්‍රවේසම් වෙන්න.

රිවි කාර්මයිකල් විසිනි.

"නොයෙක් බොරු අනාගතවක්තෘවරු නැගිට බොහෝ දෙනෙකු මුලාකරන්නෝය." (මතෙව් 24:11)

"එකල යමෙක් කථාකොට බලව, ක්‍රිස්තුස් වහන්සේ මෙතනය, නොහොත් එතන යයි නුඹලාට කියන්නේ නම් විශ්වාස නොකරල්ලා. වක්නිසාද බොරු ක්‍රිස්තුස්වරුද, බොරු අනාගතවක්තෘවරුද නැගිට පුළුවන් නම් තෝරාග නු ලැබූවන් පවා මුලාකරන ලෙස මහත් ලකුණු ද පුදුම ද දක්වන්නෝය. බලව, මම නුඹලාට කලින් කීවෙමි." (මතෙව් 24:23-25)

"මාගේ පිටත්ව යාමෙන් පසු රිළුට අනුකම්පා නොකරන ඉෂ්ටවූ වෘක්කයන් නුඹලා අතරට පැමිණෙන බව දනිමි. නුඹලා අතරෙන්ම මනුෂ්‍යයන් නැගිට තමුන් පස්සේ යන්ට ගෝලයන් අදගන්නා පිණිස කාර්ණ පෝලා කථා කරනවා ඇත. එබැවින් මා තුන් අවුරුද්දක් මුළුල්ලේ රෑ, දවල් දෙකේ කදුළු වලින් යුක්තව සියල්ලන්ට නිරතුරු අවවාද දුන් බව සිහිකොට අවදිව සිටපල්ලා. " (ක්‍රියා 20:29-31)

අන්තිම දවස්වලදී බොරු ගුරුවරු සහ බොරු අනාගතවක්තෘවැරන් පිළිබඳව අවදියෙන් සිටින ලෙස ශුද්ධ ලියවිල්ලේ අපට ඉතා පැහැදිලිව අනතුරු ඇඟවයි. මෙම අවධානම සියුම්ව පවතින්නේ එවැනි ව්‍යාජ නායකයන් පැන නගින්නේ අප අතරන්ම නිසාය. (ක්‍රියා 20:30, 2 ප්‍රේත්‍රුස් 2:1) ඔවුන් බැටළු වේශයෙන් පැමිණෙති. (මතෙව් 7:15) නොදැනුවත්වම (රහසින්) රිංගා ගනියි. (යුදස් 1:4) ඔවුන් විනාශකාරී වැරදි ඉගැන්වීම් රහසින් උපදවන්නෝය. (2 ප්‍රේත්‍රුස් 2:1) දෙවියන් වහන්සේගේ සෙනඟ නොමඟ යැවීම සඳහා මහත් පුදුම හා ලකුණු සිදු කරති. (මතෙව් 24:24) ඔවුන් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රොපේතවරුන්ගේ වේෂය ගන්නා වූ වංචාකාර මනුෂ්‍යයෝය. එමෙන්ම ධර්මිෂ්ඨකමේ සේවකයන්ගේ වේශය ගනියි. (2 කොරින්ති 11 : 13-15)

අන්තරාය තවත් උග්‍රවන්නේ අන්තිම දවස්වලදී බොහෝ මනුෂ්‍යයන්ගේ ස්වභාවය නිසාය. **"වක්නිසාද ඔවුන් සාරවත් ඉගැන්වීම නොඉවසා කනස්සල්ලෙන් ඇතුව, තමුන්ගේ ආශාවල් ලෙස තමුන්ටම ගුරුවරුන් රැස්කරගෙන සත්‍යයට කන්නොදී මුතුන්ඩවලට හැරී යන කාලය පැමිණෙන්නේය."** (2 තිමෝති 4 : 3-4) යෙරමියාගේ දවස්වල තත්ත්ත්වයත් ඒ ආකාරයෙන්ම තිබුණේය. පුදුම වූ භයංකාර වූ දෙයක් දේශයේ සිදු වී තිබේ. අනාගතවක්තෘවරු බොරුවට අනාගතවාක්‍ය කියති. පූජකයෝ ද ඔවුන්ගේ ආධාරයෙන් ආණ්ඩු කෙරෙති. මාගේ සෙනඟද එසේවීමට ප්‍රිය වෙති. නමුත් එහි කෙළවරදී නුඹලා කරන්නේ කුමක්ද ..? (යෙරමියා 5:30-31) වර්තමානයේ සභාව තුළ සිටින බොහෝ මනුෂ්‍යයන් ද බොරු ගුරුවරුන්ගේ පණිවිඩය, සේවය, පිළිගැනීමට සහ වැළඳගැනීමට දොරටු විවෘත කර තිබේ. ස්වාමීන් වහන්සේ ව්‍යාජ නායකයන් (බොරු ගුරුවරු, අනාගතවක්තෘවරු, අපෝස්තුළුවරු සහ එඬේරුන්) පිළිබඳව අනතුරු අගවනවා පමණක් නොව, දේවභක්තිකයන්ගෙන් ව්‍යාජ නායකයන් වෙන්කර හඳුනාගන්නේ කෙසේද කියා දේව වචනයේ අපට පෙන්වා දී තිබෙන නිසා උන්වහන්සේට ස්තුතිවේවා. එවැනි කැපී පෙනෙන ලකුණු හතක් සලකා බැලීමට මම ඔබට ආරාධනා කරමි.

(1) ව්‍යාජ නායකයන්ගේ උවමනාව අනිත් අය තමන්ට සේවය කිරීම වන අතර සැබෑ නායකයන්ගේ ආශාව අනිත් අයට සේවය කිරීමයි.

දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ උතුම්ව සිටින අය දුර්වලයන්ට සේවය කළ යුතු බව යේසුස් වහන්සේ අවධාරණය කළ සේක. **"නුඹුන් යේසුස් වහන්සේ මෙන් ඉන්නට ඕනෑ. ඔහු මුදල් හා ද්‍රව්‍යමය දේ කෙරෙහි අවධානය යොමු කරන විට සහ දේව භක්තිය වූලාභයය වාසි සඳහා මාධ්‍යයක් බව ඉගැන්වීමයි. ශුද්ධලියවිල්ලේ එයට විරුද්ධව පැහැදිලිවම අනතුරු අඟවා තිබුණ ද මෙය වර්තමානයේ** පැතිරී තිබෙන්නා වූ ව්‍යාජ ඉගැන්වීමකි. උදාහරණ වශයෙන් අපෝස්තුළු පාවුල් ව්‍යාජ දේවධර්මයේ සන්දර්භය පිළිබඳව මෙසේ ලියා ඇත. **"යමෙක් සාර වූ වචනවලට, එනම් අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ වචනවලටත්, භක්තිවන්තකමේ හැටියට වූ ධර්මයටත් එකඟ නොවී, වෙනස් ධර්මයක් උගන්වන්නේ නම්, ඔහු කිසිවක් නොදැන වචන ගැන ප්‍රශ්න කිරීමෙන් ද, වාද කිරීමෙන් ද උවතුව අහංකාරව සිටියි. එයින් ඊර්ෂ්‍යාවද, විවාදය ද, අපහාසය ද, නපුරු යයි සිතීම් ද දුෂ්ටවුන සිත් අත්නා වූ සැබෑවෙන් වෙන්ව සිටින්නා වූ භක්තිවන්තකම ලාභයට මාර්ගයකැයි සිතන්නා වූ මනුෂ්‍යයන්ගේ නිරන්තර තාඟ ද උපදින්නේය."**

"ලන් පවෂීන් සතුටුවීම සමඟ භක්තිවන්තකම මහත් ලාභයක්වය. වක්නිසාද අපි මේ ලෝකයට කිසිවක් ගෙනාවේ නැත. එයින් අපට කිසිවක් ගෙයන්ටත් බැරිය. තවද කෑම, ඇඳීම, අපට අත්නම් එයින් සතුටු වන්නෙමුව. නුමුත් ධනවත්වෙන්ට ආශා අත්තෝ පරීක්ෂාවකද, වලපතකද මනුෂ්‍යයන් නාස්තියෙන් විනාශයෙන් ගිල්වන්නා වූ අඥාන වූ අන්තරාය සහිත බොහෝ තෘෂ්ණාවලද වැටෙන්නෝය. වක්නිසාද සස්තු තෘෂ්ණාව සියලු ආකාර නපුරේ මුලක්ය. සමහරු ඊට ආලයවී අදහිල්ලෙන් මුලාව ගොස් බොහෝ වේදනාවලින් තමුව අනගන්නෝය." (1 තිමෝති 6:3-10)

පරණ ගිවිසුමේ දවස්වලදීත් දෙවියන් වහන්සේගේ සෙනඟ එම ගැටළුවෙන්ම පීඩා විත්දෝය. යෙරමියා, මීකා, යෙසායා විලාප කියමින් ප්‍රකාශ කරන දෙයට ඇහුම්කන් දෙන්න. **"වක්නිසාද ඔවුන්ගෙන් කුඩා අය පටන් ලොකු අය දක්වා සියල්ලෝම අයුතු ලාභය අනුව යති. ප්‍රොපේතවරයා පටන් පූජකයා දක්වා සියල් ලෝම වංචාකම් කරති."** (යෙරමියා 6:13) **" ආණ්ඩුකාරයෙනි, වේක අසාපල්ලා එහි ප්‍රදානියෝ තෑගිගක් නිසා විනිශ්චය කරති. පූජකයෝ කුලුපට උස්නවති. එහි අනාගතවක්තෘවරුද විලේට පේනකියති. එහෙත් ඔවුහු සේවාවින් වහන්සේ කෙරෙහි පිහිටා සිට ස්වාවින් වහන්සේ අප අතරෙහි සිටිනවා නොවේද ... ? අප පිටට විපත්තියක් නොපැමිණෙන්නේ යයි කියති. (මීකා 3:11) "එසේය, ඒ බල්ලෝ ගිලුව කිසිකලෙක තෘප්තියට නොපැමිණෙති. ඔවුන් විමසන්ට නොදන්න එඬේරුය. ඔවුන් එකිනෙකා තමා තමාගේ ප්‍රයෝජනය පිණිස තම තමාගේ මාර්ගයට හීන්දුවටම හැරිගියෝය."** (යෙසායා 56:11)

යේසුස් වහන්සේ මෙසේ අනතුරු ඇඟවූ සේක. **"තවද උන්වහන්සේ කථාකොට, සියලු ආකාර ලෝභකමෙන් ප්‍රවේශවිවෙන්ට බලාගනිල්ලා. වක්නිසාද මනුෂ්‍යයෙකුට කොපමණ දේපල තිබුණත් ඔහුගේ ජීවිතය එහි පිහිටා නැතැයි ඔවුන්ට කී සේක."** (ලුක් 12:15) **අපි ව්‍යාජ ගුරුවරුන් ගැන විමසිලිමත් විය යුත්තේ ඔවුන්ට තෘෂ්ණාධික හඳවත් ඇති බැවිනි. "ඔවුහු කාමවික්‍රියාචාරයෙන් පිරුණා වූ, පාපයෙන් වළකින්නට නුපුළුවන් අස් අත්තෝය. ඔවුහු අස්ථීර ආත්ම පොළඹවන්නෝය. තෘෂ්ණාවට පුරුදු සිතක් අත්තෝය. ශාපයේ දරුවෝය."** (2 ප්‍රේත්‍රුස් 2:14) **"තෘෂ්ණාව නිසා ඔවුන් වංචා වචනවලින් නුඹලා වෙළඳාමක් කරගන්නවා ඇත. පුරාණයේ සිට පවතින ඔවුන්ගේ විනිශ්චය ප්‍රමාද නොවන්නේය. ඔවුන්ගේ විනාශය ද නිදා නොගනියි. "** (2 ප්‍රේත්‍රුස් 2:3) ඇත්ත වශයෙන්ම ඔවුන් බයිබලයේ සත්‍යතාවය මුලා කිරීමට භාවිතා කර ඇත. එම නිසා අවසානයේ දී මුදල් සහ භෞතික තත්වයන්වලට ඔවුන්ගේ අවධානය දී ඇත.

පාවුල් වැනි දේවභක්තික නායකයෙකුට මෙය කොපමණ වෙනස්ව තිබුණා ද කියා සෝදිසි කර බලන්න. "කිසිවෙකුගේ රිදීයටවත්, රනටවත්, ඇඳුම්වලටවත් ආශා නොවීමි. මටත් මා සමඟ සිටිවුන්ටත් වුවමනා වූදේ සපයා ගැනීමට මේ අත්වලින් වැඩ කළ බව නුඹලාම දන්නහුය. මෙසේ වැඩ කරමින් නුඹලා දුර්වලයන්ට උපකාර කටයුතු බවද ගැනීමට වඩා දීම ආශීර්වාදයකැයි ස්වාමීවූ යේසුස් වහන්සේම කී වචන සිහි කටයුතු බවද පෙන්වා සියල්ලේදී නුඹලාට ආදර්ශයක් වූයෙමියි කීවේය.

6 පිටුවට

5 පිටුවෙන්

බොරු ගුරුවරුන්ගෙන් සහ...

(ක්‍රියා 20 : 33-35) පාවුල්තුමා මෙසේ ද ලියා ඇත. **"එක්නිසාද අපි දෙවියන් වහන්සේගේ වචනය බොහෝ දෙනා මෙන් නරක් නොකර, අවංකකමින්ද, දෙවියන් වහන්සේගෙන් ලැබුණු ලෙසද දෙවියන් වහන්සේ ඉදිරියෙහි ක්‍රිස්තුස් වහන්සේ තුළ කථාකරමුව."** (2 කොරින්ති 2:17) දේවභක්තික නායකයන් මුදලට ප්‍රේම කරන්නේ නැත. **"ඔහු බේබද්දෙක් නොවූ, ගහගන්නෙක් නොවූ, ඉවසිලිවන්ත වූ, ඵලවරකාරයෙක් නොවූ, වස්තු තෘෂ්ණාව නැත්තා වූ ...."** (1 තිමෝති 3:3) පාවුල්තුමා තිමෝතිට මෙසේ ලියුවේය. **"තවද කෑම, ඇඳීම අපට ඇත්නම් එයින් සතුටුවන්නෙමු."** (1 තිමෝති 6:8)

● (3) ව්‍යාජ නායකයන් පාපයට සුදු හුණු ගාන අතර සැබෑ නායකයන් පසුතැවිලිවීම දේශනා කරති.

දෙවියන් වහන්සේ විසින් එවන ලද සෑම මනුෂ්‍යයෙකුගේම පණිවිඩයේ අනිවාර්යය අංගයක් වන්නේ පාපය ගැන පසුතැවිලි වී දෙවියන් වහන්සේ වෙතට නැවත පැමිණීමට කැඳවීමයි. උදාහරණයක් වශයෙන් මීකා අනාගතවකතෘවරයා ඔහුගේ කාලයේ සිටි බොරු අනාගත වකතෘවරුන් සහ පූජකයන්, යහපතට වෛරකර නපුරට ප්‍රේම කරමින් දෙවියන් වහන්සේගේ සෙනගව නොමඟ යැවූ අය සමඟ ඔහුගේ සේවය සන්සන්දනය කර වෙනස දැක්වීය. **"එහෙත් මම වනාහී යාකොබ්ට ඔහුගේ වරදත්, ඊශ්‍රායෙල්ට ඔහුගේ පාපයත් දන්වන්ට ස්වාමීන් වහන්සේගේ ආත්මය ඇතිව බලයෙන්ද, යුක්තියෙන් ද, ධෛර්යයෙන් ද පූර්ණව සිටිමි."** (**මීකා 3:8**) **පරණ** ගිවිසුමේ දී දෙවියන් වහන්සේ වෙතින් වූ සෑම අනාගතවකතෘවරයෙක්ම පසුතැවිලිවීම දේශනා කළේය. **"මාගේ සියලු සේවකයන් වූ අනාගතවකතෘවරුන් නුඹලා ළඟට එවීමි. අළුයම් වේලාවේ පටන්ම එවා නුඹලා එකිකොා තම තමාගේ නපුරු මාර්ගයෙන් හැරී අන් දෙවිවරුන්ට සේවය කරන්ට ඔවුන් පස්සේ නොගොස් නුඹලාගේ ක්‍රියා හරිගස්සා ගනිල්ලා. එවිට නුඹලාටත්, නුඹලාගේ පියවරුන්ටත් මා විසින් දුන් දේශයෙහි නුඹලා වාසය කරන්නහුයයි කීවෙමි. එහෙත් නුඹලා කන් යොමු කළේවත් මට අහුලිකන් දුන්නේවත් නැත."** (යෙරමියා 35:15)

පසුතැවිලීම අළුත් ගිවිසුමේ ඉගැන්වීමේ සහ දේශනා කිරීමේ ප්‍රධාන ඉලක්කය වූයේය. යොහාන් බොතීස්ත පසුතැවිලිවීම දේශනා කෙළෝය. (මතෙව් 3:1-2) යේසුස් වහන්සේ පසුතැවිලිවීම දේශනා කලසේක. (ක්‍රියා 2:38, 3:19-20, 26:20) සහ සතට දෙන ලද පණිවිඩයේ දී යේසුස් වහන්සේ නොකඩවා පසුතැවිලිවීමේ අවශ්‍යතාවය අවධාරණය කළ සේක. (එළිදරව් 2:5, 16,21,23,3:3, 19) දේවභක්තික නායකයන් පාපයේ කාරණා මගහරින්නේ නැත. නමුත් පසුතැවිලිවී නැවත හැරෙන ලෙස දැඩිව ඉල්ලා සිටියි. ඔවුන් මනුෂ්‍යයන්ට අවවාද කරන්නේ පාපය අතහැර ස්වාමීන් වහන්සේ වෙතට ආපසු හැරී එන ලෙයසි.

කෙසේ වෙතත් බොරු ගුරුවරු සහ බොරු අනාගතවකතෘවරු පාපයේ බරපතලකම පහත හෙළනු ලබයි. ස්වාමීන් වහන්සේ ඔවුන් ගැන මෙසේ ප්‍රකාශ කරන සේක. **"නුඹලාට සමාදානය වන්නේය කියා ස්වාමීන් වහන්සේ කියා තිබේ යයි මා සුළුකරන්නන්ට ඔවුහු කියා කියා සිටිති. විපතක් නුඹලා පිටට නොපැමිණෙන්නේ යැයි තමුන්ගේ සිත්වල මුරණ්ඩුකමේ හැසිරෙන සියල්ලන්ටද ඔවුහු කියති."** (යෙරමියා 23:17) පාපය ගැන තරවටු කරනවා වෙනුවට ඔවුන් ඇත්තටම ක්‍රියා කරන්නේ මෙසේය. **"යොරුසලමේ ප්‍රොපේතවරුන් අතරෙහිත් භයංකාර වූ දෙයක් වන කාමවික්‍රියාචාරය කිරීමත් බොරුකාරකමෙන් හැසිරීමත් දුටිමි. මෙසේ කිසිවෙක් තමාගේ නපුරුකමෙන් නොහැරෙන හැටියට ඔවුහු නපුරා කරන්නන්ගේ අත් සවිකරති. ඔවුන් සියල්ලෝම මට සොදොම මෙන්ද එහි වැසියෝ ගෙමෝරාව මෙන් ද වී සිටිති. "** (යෙරමියා 23:14) බොරු ගුරුවරු සහ බොරු අනාගතවකතෘවරු වැඩි සැලකිල්ලක් දක්වන්නේ අන්‍යයන් සතුටු කිරීමට සහ එක් එක් පුද්ගලයාට තමාවම ප්‍රතික්ෂේප කර තම කුරුසිය දරාගෙන ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කිරමට වඩා තමාටම උපකාර කර ගැනීමට යොමු කිරීමයි. ඔවුන් පාපය බැරෑරුම් ලෙස සලකන්නේ නැත. විනිශ්චය වලක්වා ගැනීමට එය හෙළි නොකරයි. ඔවුන් අන් අයව සමච්චජලයට ලක් කරන අතර පසුතැවිලිවීමකින් හා කීකරුවීමකින් තොරව දෙවියන් වහන්සේගෙන් අනුග්‍රහය ලැබෙන බවට පොරොන්දු වෙති.

● (4) ව්‍යාජ නායකයන් දෙවියන් වහන්සේගේ වචනය වැරදි ලෙස භාවිතා කරනු ලබයි. සැබෑ නායකයින් දෙවියන් වහන්සේගේ සම්පූර්ණ උපදෙස් ප්‍රකාශ කරති.

සැබෑ නායකයින් පසුතැවිලිවීම ගැන උගන්වනවා සහ දේහනා කරනවා පමණක් නොව, ඔවුන් එය අනාවරණය කිරීමට විශ්වාසවන්තව සිටති. **"එක්නිසාද දෙවියන් වහන්සේගේ මුලු අභිප්‍රාය නුඹලාට ප්‍රකාශ කිරීමෙන් නොවැලකුණෙමි."** (**ක්‍රියා 20:27**) ඔවුන් එය අවබෝධ කර දෙති. **"දෙවියන් වහන්සේගේ මනුෂ්‍යයා සම්පූර්ණව සියලු යහපත් ක්‍රියාවලට සූදානම්ව සිටින පිණිස දේවානුභාවයෙන් දුන් මුළු ලියවිල්ල ඉගැන්වීමටත්, තරවටුවටත්, හික්මවීමටත්, ධර්මිෂ්ඨකම ගැන ගුරුකම්දීමටත් ප්‍රයෝජනවත්ව තිබේ."** (2 තිමෝති 3:16) ඔවුන් දෙවියන් වහන්සේගේ වචනය විකෘති කරන්නේවත්, එය දියාරු කරන්නේවත් නැත. නමුත් ඔවුන් වචනය දේශනා කරනවා ඇත. **"වචනය දේශනා කරපන්න. කලටත්, අකලටත් වැඩේයේදී සිටපන්න. සියලු ආකාර ඉවසිලිවන්තකමෙන් සහ ඉගැන්වීමෙන් තරවටු කර, අවවාද කර අනුශාසනා කරපන්න කියායැ."** (2 තිමෝති 4:2) ඔවුන් ලැජ්ජා වෙන්නේ නැති, සැබෑවේ වචනය නිවැරදිව පහදා දෙන දෙවියන් වහන්සේට ඒත්තු වුනාවූ, වැඩ කරන්නන් ලෙස ක්‍රියා කිරීමට උන්නදු වෙති. (2 තිමෝති 2:15) ඔවුන් තමන්ගේ ම වචන දේශනා කරන්නේ හෝ උගන්වන්නේ නැත. නමුත් දෙවියන් වහන්සේගේ සැබෑ වූ වචනය උගන්වති. එය කොයිතරම් ජනප්‍රිය වූවත්, නොවූවත් ඔවුන් දෙවියන් වහන්සේගේ වචනය පැහැදිලිව හා බලවත්ව ප්‍රකාශ කරයි. ඔවුන් ජනප්‍රිය දේවධර්ම අභිමතයන් අනුග මනය නොකරයි. නමුත් ..., ප්‍රේමවන්තයෙනි, අපේ පොදු ගැලවීම ගැන නුඹලාට ලියා එවන්ට මුළු උත්සාහය දරන විට, එක වරක්ම ශුද්ධවන්තයන්ට භාර දුන් ඇදහිල්ල උදෙසා උනන්දු ආකාරයෙන් පොර අල්ලන ලෙස අවවාද කරමින් නුඹලාට ලියා එවන්ට මට ඕනෑවිය. (යුදස් 1:3)

අනිත් අතට බොරු ගුරුවරු සහ බොරු අනාගතවකතෘවරු සත්‍යයේ මාර්ගයට අපහාස කරති. (2 ප්‍රේතුස් 2:2) ඔවුන් තම අරමුණු ඉටුකරන ශුද්ධ ලියවිල්ලේ කොටස් වලින් පමණක් උපුටා ගන්නා අතර ඉන්පසුව පවා ඔවුන් දෙවියන් වහන්සේගේ වචනය ඔවුන්ගේ වාසියට විකෘති කරති. (යෙරමියා 23:36, ගලාති 1:7, 2 ප්‍රේතුස් 3:16) **"සේනාවල ස්වාමීන් වහන්සේ මෙසේ කියන සේක. නුඹලාට අනාගතවාක්‍යය කියන්නා වූ ප්‍රොපේතවරුන්ගේ වචනවලට කන්නොදෙල්ලා. ඔවුහු නිශ්චල ප්‍රාර්ථනා ඇතිව සිටින්ට නුඹලාට උගන්වති. ඔවුහු ස්වාමීන් වහන්සේගේ මුඛයෙන් නොවන තමුන්ගේ ම සිතේ දර්ශනයක් නුඹලාට කියති."** (යෙරමියා 23:16) තවද, ස්වාමීන් වහන්සේගෙ වචනය මා වෙතට පැමිණ කියනුයේ මනුෂ්‍යය පුත්‍රය අනාගතවාක්‍ය කියන්නා වූ ඊශ්‍රායෙල්හි අනාගතවකතෘවරුන්ට විරුද්ධව නුඹ අනාගතවාක්‍යය කියමින්, තමුන්ගෙ ම සිතින් උපදවා අනාගතවාක්‍යය කියන්නන්ට මෙසේ කියාපන්න. ස්වාමීන් වහන්සේගේ වචනය අසාපල්ලා. ස්වාමී වූ දෙවියන් වහන්සේ මෙසේ කියන සේක. කිසිවක් නොදැක, තමුන්ගේම ආත්මය පස්සේ යන්නා වූ මෝඩ වූ අනාගතවකතෘවරුන්ට දුක්වේ. (එසකියෙල් 13 1-3)

ඇත්ත වශයෙන්ම බොරු ගුරුවරු ඉතා රැවටිලිකාර ලෙස ඒත්තු ගන්වනු ලබන්නෝය. මේ නිසා දෙවියන් වහන්සේගේ සොනඟ අවදියෙන් සිටිය යුතු අතර දෙවියන් වහන්සේගේ වචනයේ සම්පූර්ණ උපදෙස් සිතට ගෙන වර්තමාන ඉගැන්වීම් ගැන සලකා බැලිය යුතුය. අතීතයේ සිට පැවත එන ධර්මයේ ආලෝකයෙන් බොහෝ දෙනෙකුව නොමඟ යවන බව යේසුස් වහන්සේ අනතුරු ඇඟවූ සේක. අපි ක්‍රිස්තුස් වහන්සේ තුළ වර්ධනය විය යුතුය. "තවද අපි තවත් මනුෂ්‍යයන්ගේ වංචාවෙන්ද, ප්‍රයෝගයෙන් ද, රැවටීලි සහිත උපමාරුවෙන් ද හටගන්න සියලු ආකාර ඉගැන්වීම් නැමති සුළඟින් ඇත මෑත විසිවෙමින් ගෙනයනු ලබන්නා වූ බාලයන් නොවන පිණිසත්, ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස් වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය. (එපීස 4:14-15)

● (5) ව්‍යාජ නායකයන් ක්‍රිස්තුස් වහන්සේගේ දේවධර්මය විකෘති කරති. සැබෑ නායකයන් ඔවුන්ගේ අවධානය ක්‍රිස්තුස් වහන්සේ මත රඳවාගනිති.

බොරු ගුරුවරුන්ගේ සහ බොරු අනාගතවකතෘවරුන්ගේ කේන්ද්‍රීය ලක්ෂණයක් වන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලිකත්වය සහ ක්‍රිස්තුස් වහන්සේගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් වූ දේවධර්මය විකෘති කර තිබීමයි. අපෝස්තුළු ප්‍රේත්‍රුස් ඒ පිළිබඳව අනතුරු ඇඟවා තිබේ. **" නුවුත් සෙනඟ අතරේ බොරු ප්‍රොපේතවරුද සිටියෝය. එලෙසම විනාශකා ධර්මභේද හඟිසින් උපදවමින් ද තමුන්ව මිලේටගත් ආචාරීන් වහන්සේව එපාකරමින්ද තමුන් පිටට ශීඝ්‍ර විනාශය පමුණුවාගන්නා වූ බොරු ගුරුවරු නුඹලා අතරෙත් වන්නෝය."** (2 ප්‍රේත්‍රුස් 2:1) යුද් ව්‍යාජනායකයන් කවුද කියා පැහැදිලි කර ඇත. **" එක්නිසාද පුරාණ කාලයේ දී මේ දඬුවමට නියමකොට තැබුවාවූද, අභක්තිකවූද, අපගේ දෙවියන් වහන්සේගේ කාරුණාව සල්ලාලකමට හරවා ගන්නාවූද අපගේ එකම අධිපති වූ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව එපා කාන්නාවූද මනුෂ්‍යයන් වගයක් හඟිසින් ඇතුල්ව සිටිති. "** (යුදස් 1:4) ඒ ආකාරයෙන්ම අපෝස්තුළු පාවුල් ද අපට පැහැදිලි කර දී ඇත. **"ක්‍රිස්තුස් වහන්සේට එකඟ නැත්තා වූ මනුෂ්‍යයන්ගේ පරම්පරාගත නියෝගවලත් ලෝකයේ ගුරුකම්වලත් ප්‍රකාරයට තිබෙන පණිවිතකමද හිස්වූ රැවටිලිකාරකමද කාරුණිකොටගෙන නුඹලා කොල්ලයක් කරගන්න කිසිවෙක් නොසිටින හැටියට බලාගනිල්ලා. එක්නිසාද උන්වහන්සේ තුළ දේවත්වයේ සියලු සම්පූර්ණකම ශරීරාකාරයෙන් වාසය කරන්නේය."** (කොලොස්සි 2:8-9)

ක්‍රිස්තුස් වහන්සේගේ පුද්ගලභාවය සහ ක්‍රියාව පිළිබඳ දේව ධර්මය ඇත්ත වශයෙන්ම අතිශයින් වැදගත්වේ. අළුත් ගිවිසුමේ ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව මුළු අවධානය මතෙව් පොතෙන් ආරම්භ වී, **"ආබ්‍රහම්ගේ පුත්‍රයා වන දාවිත්ගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පරම්පරාවේ පොතය."** (මතෙව් 1:1) එළිදරව් පොතේ අවසානය දක්වා දිවයයි. **"ස්වාමී වූ යේසුස් වහන්සේගේ කරුණාව ශුද්ධවන්තයන් හා සමඟ වේවා .... ආමේන්!"** (එළිදරව් 22:21) ඒ අතරතුර දෙවියන් වහන්සේගේ වචනය තුළ, කතාන්දරයක් තුලින් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිදුවීම, උන්වහන්සේගේ දේත්වය. උන්වහන්සේගේ බලයෙන් පූර්ණ වූ සේවය, උන්වහන්සේගේ පාපරහිත ජීවිතය, පූජාවක් ලෙස සිදු වූ උන්වහන්සේගේ මරණය, උන්වහන්සේගේ නැවත නැගිටීම, පියාණන් වහන්සේගේ දකුණු පැත්තට උන්වහන්සේගේ ඔසවා ගැනීම සහ උන්වහන්සේගේ නැවත පැමිණීමේ පොරොන්දුව අවධානයට ලක්කර ඇත.

ක්‍රිස්තුස් වහන්සේගේ කේන්ද්‍රීයත්වයේ ආලෝකය අනුව බොරු ගුරුවරුන්, බොරු අනාගතවකතෘවැන්, ව්‍යාජ ආගමික කණ්ඩායම් ක්‍රිස්තුස් වහන්සේගේ දර්ශනය විකෘති කිරීම පුදුමයක් නොවේ. අන්ත ක්‍රිස්තුස්ගේ ආත්මය බොහෝ දුරට ලෝකය තුළ ක්‍රියාත්මක වේ. (1 යොහාන් 4:3) එම ආත්මය ක්‍රිස්තුස් වහන්සේ තුලින් දෙවියන් වහන්සේට

7 පිටුවට

6 පිටුවෙන්

බොරු ගුරුවරුන්ගෙන් සහ...

කිරීමට අවශ්‍යව තිබෙන සියල්ලට විරුද්ධ වේ. ක්‍රිස්තුස් වහන්සේගේ ආශ්චර්යමත් උපත, උන්වහන්සේගේ නැවත නැගිටීම, උන්වහන්සේගේ දෙවන පැමිණීම, උන්වහන්සේගේ පුද්ගලභාවය සහ ක්‍රියාව කිසියම් ආකාරයකින් අවතක්සේරු කරන ඕනෑම පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් පිළිබඳව ප්‍රවේශම් වන්න. අනික් අතට සැබෑ නායකයන් ක්‍රිස්තුස් වහන්සේ කෙරහි අවධානය යොමු කරමින් සියල්ලටම සහ සියල්ලන්ටම වඩා උන්වහන්සේව උසස් කරනු ලබයි. ඔවුන්ගේ ඉගැන්වීම සහ දේශනා කිරීම තුළ ක්‍රිස්තුස් වහන්සේව කේන්ද්‍රවී ඇත. (1 කොරින්ති 1:23, කොලොස්සි 1:28) ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ දේවධර්මය නව ගිවිසුමේ සහ ඉතිහාසයේ සිට සභාවේ සම්ප්‍රදායට අනුකූලව තිබේ. අපෝස්තුවු පාවුල් ප්‍රකාශ කළ ලෙස, **"එක්නිසාද අපි අප ගැනම නොව ක්‍රිස්තුස් යේසුස් වහන්සේ ස්වාමීන් වහන්සේය කියාද, යේසුස් වහන්සේ නිසා අපි නුඹලාගේ දාසයෝ කියාද ප්‍රකාශ කරවුව."**(2 කොරින්ති 4:5)

● (6) ව්‍යාජ නායකයන්ට අහක්තික චරිතයක් ඇත. සැබෑ නායකයෝ නිරතුරුවම දේවභක්තිකයෝ වෙති

ව්‍යාජ නායකයන්ගේ තවත් කැපී පෙනෙන ලකුණක් වන්නේ අහක්තික චරිතයයි. පරණ ගිවිසුමේ දවස්වලදී ස්වාමීන් වහන්සේ යෙරමියා තුලින් විලාප නැගූ සේක. **"ප්‍රොපේතවරුන් ගැනය. මාගේ සිත මා තුළ බිඳී මාගේ සියලු අට වංචලවී තිබේ. ස්වාමීන් වහන්සේ නිසාත්, උන්වහන්සේගේ ශුද්ධ වූ වචන නිසාත් මම මත්වී සිටින්නෙක්ද මුදික පානයට යටවී සිටින මනුෂ්‍යයෙක් ද මෙන් වෙමි. එක්නිසාද දේශය කාමමිත්‍රචාරීකයන්ගෙන් පිරී තිබේ. ශාපයක් නිසාද දේශය වැළපෙයි. කාන්තාරයේ තෘණබිම් වියළී තිබේ. ඔවුන්ගේ හැසිරීම නපුරුය. ඔවුන්ගේ බලය ද හරිනැත. එක්නිසාද ප්‍රොපේතවරයා සහ පූජකයාත් දූෂ්‍ය වී සිටිති. එසේය, මාගේ ගෘහයෙහි පවා ඔවුන්ගේ නපුරුකම මට සවිඳ යයි ස්වාමීන් වහන්සේ කියන සේක. එබැවින් ඔවුන්ගේ මාර්ගය අඳුරේ ලිස්සන ඉඩම් මෙන් ඔවුන්ට වන්නේය. ඔවුහු පන්නනු ලැබ වැටෙන්නෝය. මම ඔවුන් පිටට විපත්තිය එනවි ඔවුන්ට දඬුවම් කිරීමේ අවුරුද්දැ පමුණුවන්නෙමියි ස්වාමීන් වහන්සේ කියන සේක. සමාරියේ ප්‍රොපේතවරුන් අතරේ මම අප්‍රිය්‍ය කිඵවුකම ගැනිති. බාල්ගේ නාමයෙන් අනාගතවාක්‍යය කියා මාගේ සෙනඟ වූ ඊශ්‍රායෙල් වුහු මෙහෙවුවෝය. යෙරුසලමේ ප්‍රොපේතවරුන් අතරේ හිත් භයංකරවූ දෙයක් වන කාමමිත්‍රාචාරය කිරීමත්, බොරුකරුකමෙන් හැසිරීමත් දුටිමි. මෙසේ කිසිවෙක් තමන්ගේ නපුරුකමෙන් නොහැරෙන හැටියට ඔවුහු නපුරුකරන්නන්ගේ අත් සවිකරති. ඔවුන් සියල්ලෝ මට සොදොම මෙන්ද එහි වැසියෝ ගෙමෝරාව මෙන්ද වී සිටිති."** (යෙරමියා 23 : 9-14) ගෙපනියා අනාගත වකතෘත් එයට මෙසේ එකතු කර ඇත. **"ඇගේ ප්‍රොපේතවරු අහංකාර ද්‍රෝහී මනුෂ්‍යයෝය. ඇගේ පූජකයෝ ශුද්ධ දේ කෙලහුවෝය. ව්‍යවස්ථාව පෙරළුවෝය."** (ශෙපනියා 3:4) නායකයන් සදාචාරමය දූෂණයෙන්, දුෂ්ඨකමෙන්, බොරුවෙන්, නොසැලකිලිමත්කමෙන් සහ ද්‍රෝහිකමෙන් පිරිසිටීම කොයිතරම් බේදජනකද ...? ඔවුන්ගේ දූෂණය මුළු දේශයටම පැතිරීගොස් තිබුණි. (යෙරමියා 23:15)

නව ගිවිසුමේ කාලයේ ද ව්‍යාජ නායකයන්ගේ ස්වභාවය ඒ ආකාරයෙන්ම තිබූ බව යුද් ප්‍රකාශ කරයි. **"එක්නිසාද පුරාණ කාලයේදී මේ දඬුවමට නියමකොට නැගුවාවූද, අභක්තිකවූද අපගේ දෙවියන් වහන්සේගේ කරුණාව සල්ලාලකමට හරවාගන්නාවූද අපගේ එකම අධිපතිවූ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේව එපා කරන්නාවූද මනුෂ්‍යයන් වගයක් රහසින් ඇතුල්වී සිටිති. "** (යුදස් 1:4) **"එහෙත් ඒ ආකාරයෙන්ම මොවහුත් තමුන්ගේ නිස්සාර හීන දැකීම්වලදී මාංසය කිළුටුකර ගනිති. අධිපතිකම ඍුකරති. උත්තයන්ට නින්දා කරති. "** (යුදස් 1:8) ඔවුන් තමන්ගේම ආශාවන් පසු පස හඹායන සහ උඩඟු ලෙස කථාකරන අය වෙති. තමන්ගේම වාසිය උදෙසා අනිත් අයට චාටු බස් දොඩවන අය වේ. (යුදස් 1:16) අපෝස්තුළු පේතෘස් ද ඔවුන් මාංශය සතුටු කරන ආකාරය, අධිකාරය හෙළාදකින ආකාරය, රැවටීම සහ පාපයේ ජීවත්වන ආකාරය සටහන් කරයි. (2 පේතෘස් 2:10-14) ඔවුන් නිදහස පොරොන්දුවන අතර ඔවුන්ම දූෂණයේ වහලුන්ව සිටිති. **"ඔවුහු තමුන්ව දූෂ්‍යකමේ දාසයන්ව සිටින අතර ඔවුන්ට නිදහස දෙන්ට පොරොන්දු වෙති. එක්නිසාද යමෙක් යමෙකුගෙන් පරාජය වුණොත් ඔහු ඒ තැනැත්තාට වාල්ව සිටියි. "** (2 පේතෘස් 2:19)

එවැනි අහක්තිකකම සහ රැවටීම දක්ෂ ලෙස වසා දැමිය හැකිය. උදාහරණයක් වශයෙන් යේසුස් වහන්සේ මනුෂ්‍යයෙක් ලෙස පොළොවේ සිටි කාලයේ ද සිටි අහක්තික ආගමික නායකයන් ගැන මෙසේ ප්‍රකාශ කළ සේක. **"ලියන්නෙනි, චිරිසිවරුනි, වංචාකාරවූ නුඹලාට දුක්වේ. එක්නිසද නුඹලා සුදුකල් සොහොන් ගෙවලට සමානය. ඒවා පිටින් ලස්සනව පෙනෙන නමුත් ඇතුලේ විනී ඇටවලින්ද සියලු අපවිත්‍රකමින් ද පිරී තිබේ. එසේම නුඹලාත් පිටතින් මනුෂ්‍යයන්ට ධර්මිෂ්ඨව පෙනෙන්නහුය. නමුත් ඇතුළතින් වංචාවෙන්ද, අයුතුකමෙන් ද පිරී සිටින්නහුය. (මතෙව් 23:27-28) ඇත්ත වශයෙන්ම වේ මනුෂ්‍යයන් වෙස්වලා ගැනීම තුළින් මනුෂ්‍යයන් තමන් වෙත අවධානය යොමු කරනවාට කැමති බව පෙන්වා දුන් සේක. "**(මතෙව් 23:5-7 ලූක් 20:46) ඔවුන් දේශනා කළ දේ පිලිපැද්දේ නැත. (මතෙව් 23:3) සාධාරණ, දයාවන්ත හෝ විශ්වාසවන්ත අය නොවේ. (මතෙව් 23:23)

දේවභක්තික නායකයන් ඊට හාත්පසින්ම වෙනස් බව සලකන්න. උදාහරණයක් වශයෙන් අපෝස්තුළු පාවුල් මනුෂ්‍යයන්ගේ ගෞරවය සොයමින් අනුශාසනා කළේ නැත. **"එක්නිසාද අපේ අනුශාසනාව මුළාවෙන්වත්, අපවිත්‍රකමින්වත්, වංචාවෙන් යුක්තවවත් නොකවේය. නමුත් ශුභාරංචිය බාරගැනීමට අපි සුදුස්සෝයයි දෙවියන් වහන්සේ අප ඒත්තුගත් ප්‍රකාරයටම මනුෂ්‍යයන් නොව අපේ සිත් විමසන දෙවියන් වහන්සේව සතුටුකරන ලෙස කථා කරවුව. එක්නිසාද නුඹලා දනනා හැටියට අප විසින් කිසි කලෙක ඉව්වා තන්හාවේ උපායක්වත් ව්‍යවහාර කළේ නැත. දෙවියන් වහන්සේ සාක්ෂිය. අප ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේරිතයන් හැටියට නුඹලාට බරක් වෙන්ට අපට පුළුවන්කම තිබුණු නමුත් නුඹලාගෙන්වත් , අන්‍යයන්ගෙන්වත් මනුෂ්‍යය ගෞරවය නොසෙවෙවුව."** (1 තෙසලෝනික 2:3-6) ඒ වෙනුවට ඔහුගේ හැසිරීම මෙසේ **විය. "අදහන්නාවූ නුඹලා අතරෙහි අප කොපමණ ශුද්ධව, ධර්මිෂ්ඨව, නිදොස්ව හසුරුවෙමුද කියා නුඹලාත් දෙවියන් වහන්සේත් සාක්ෂිකාරයෝය. "** (1 තෙසලෝනික 2:10) ආදර්ශයක් වන ලෙස තිමෝතිටද පැවසුවේය. **"නුඹේ යෞවන කම සුළු කරන්ට කිසිවෙකුට ඉඩනාර කථාවෙනුත්, හැසිරීමෙනුත්, ප්‍රේමයෙනුත්, අදහිල්ලෙනුත්, පිරිසිදුකමෙනුත් අදහන්නන්ට නුඹට ආදර්ශයක් වෙයන්න."** (1 තිමෝති 4:12) දේව භක්තික නායකයන් අනිත් අය උදෙසා උසස් ගුණාංග අතිව සිටිය යුතු බව තිමෝතිට උපදෙස් දුන්නේය. **"එහෙයින් නායක තෙමේ නිර්දෝෂ වූ, එක භාර්යාවකට පුරුෂයා වූ, පවණ දැන හැසිරෙන්නාවූ, සිහියෑදි පිළිවෙලක් ද ඇත්තා වූ ආගන්තුක සත්කාරයට කැමති වූ, උගන්වන්ට සමර්ථ වූ කෙනෙක්ව සිටින්ට ඕනෑය. ඔහු බේබද්දෙක් නොවූ ගෙහගන්නෙක් නොවූ, ඉවසිලිවන්ත වූ, දඹරකාරයෙක් නොවූ, වස්තු තෘෂ්ණාව නැත්තාවූ, තමාගේම පවුල හොඳින් හසුරුවා ගනිමින්, සියලු ආකාර සන්සුන්කම ඇතුව ස්වකීය දරුවන් භික්ෂවා ගන්නා වූ තැනැත්තෙක්ව සිටිය යුතුය."** (1 තිමෝති 3:2-4) තවත් ආකාරයකින් පවසන්නේ නම්, සැබෑ නායකයෙකුගේ චරිතය ඔහුගේ ජීවිතයේ සෑම අංශයකම ස්ථාවර හා දේවභක්තිකවේ. නායකයෙකුගේ ජීවිතයේ නොගැලපීම් හෝ අධර්මිෂ්ඨකමේ සලකුණු ඇති සෑම විටම ප්‍රවේසම් වෙන්න.

● (7) ව්‍යාජ නායකයන් නරක ඵලදරයි. සැබෑ නායකයන් හොඳ ඵලදරයි.

ව්‍යාජ නායකයකුගේ තවත් ඇගවීමක් වන්නේ ඔහු නරක ආත්මික ඵල ඇති කරන බවයි. යේසුස් වහන්සේ මෙසේ ඉගැන්වූ සේක. **"බොහෝ අන්‍යාගතවකතෘවරුන්ගෙන් ප්‍රවේසවී වෙයල්ලා. ඔවුහු බැටළු වේශයෙන් නුඹලා ළඟට එති. නුවුන් ඇතුළතින් ඩවුහු කෘර වූ වෘකයෝය. ඔවුන්ගේ ඵලවලින් නුඹලා ඔවුන් අඳුනාගන්නහුය. මනුෂ්‍යයෝ කටගුස්ස්වලින් මුදික ඵලවත්, ගොකටු වලින් අත්තික්කා ඵලවත් නෙලාගනිද්ද .. ? එසේම සියලු හොඳ ගස් හොඳ ඵල දරයි. නුවුන් නරක ගහ නරක ඵල දරයි. චොඳ ගහක නරක ඵලවත්, නරක ගහක හොඳ ඵලවත් හටගන්ට බැරිය. හොඳ ඵල නොදරන සියලු ගස් කපනු ලැබ ගින්නෙහි දමනු ලැබේ. එබැවින් ඔවුන්ගේ ඵල වලින් නුඹලා ඔවුන් අඳුනාගන්නහුය."** (මතෙව් 7:15-20) පිටස්තරයෙන් ඔවුන් අහිසංක, නිදොස්, මෘදු අය ලෙස පෙනී සිටිය හැකිය. නමුත් ඔවුන්ගේ සේවයේ ඵලය, ඔවුන්ගේ අවසාන සැලකිල්ල බැටළුවන්ගේ යහපැවැත්ව නොවන බව හෙළිවේ. ඔවුන් භේද ඇති කරන පුද්ගලයන්ය. **"මොවුහු මාංසිකව, ආත්මයාණන් වහන්සේ නැතුව භේද කාරන්නෝය."** (යුදස් 1:19) ඔවුන් දෙවියන් වහන්සේගේ තෘණ බිම්වල සිටින බැටළුවන් විනාශකර විසුරුවා හරින එඩේරුන්ය. (යෙරමියා 23:1) **"මාගේ පිටත්වයාවෙන් පසු රිළුට අනුකවිපා නොකරන ඉඳුරු වූ වෘක්කයන් නුඹලා අතරට පැමිණෙන බව දනිමි. නුඹලා අතරෙන්ම මනුෂ්‍යයන් නැගිට තවුත් පස්සේ යන්ට ගේලයන් අදගන්නා පිණිස කාරණා පෙරළා කථා කරනවා ඇත. (ක්‍රියා 20 : 2930)** අපෝස්තුළු පාවුල් මෙසේ අනතුරු අඟවන්නේය. **"සහෝදරයෙනි, නුඹලා ඉගෙනගත් ධර්මයට විරුද්ධව භේදයන්ද, බාධාවට හේතු වූ දේවල් ද උපදවන්නන් බලා ඔවුන්ගෙන් අහක් වෙන මෙන් නුඹලාගෙන් ඉල්ලමි. එක්නිසාද එබදු අය අපගේ ස්වාමී වූ ක්‍රිස්තුස් වහන්සේට නොව තමුන්ගේම බඩට සේවය කරමින් තමුන්ගේ සෞම්‍ය ප්‍රිය වචන වලින් අවංක අයගේ සිත් මුලා කරති."** (රෝම 16:17-18)

අනිත් අතට ක්‍රිස්තුස් වහන්සේ සභාවට දෙන සැබෑ නායකයන් ශුද්ධවන්තයන් ලෙස සන්නද්ධ වන අතර ඇදහිල්ලේ එක්සත්කම වෙනුනේ අනිත් අයව ශුද්ධවන්තයන් ලෙස ගොඩනගනු ලබයි. (එපීස 4:13) දෙවියන්වහන්සේ ඔවුන්ට දෙන ලද අධිකාරිය ඔවුන් භාවිතා කරති. **"මේ නිසා බිඳහෙළීමට නොව ගොඩනැගීම පිණිස ස්වාමීන්වහන්සේ මට දුන් බලය ලෙස මා නුඹලා ළඟ සිටින විට සත්‍යකම පාවිච්චි නොකරන පිණිස අප්‍රිය සිටින විට මේ දේවල් ලියා එවමි."** (2 කොරින්ති 13:10) ඔවුන් තම දේව සේවය අපකීර්තියට පත්කරන කිසිවක් කරන්නේ නැත. නමුත් ඒ වෙනුවට සෑම ආකාරයකින්ම ප්‍රශංසනීයව තිබෙන දේ කරයි. (2 කොරින්ති 6:3-10) විශ්වාසවන්ත සේවයක් තුළින් සුභාරංචිය ආත්මික ඵල නිපදවයි. **"ඒ සුභාරංචිය ලුව ලෝකයට මෙන් නුඹලා වෙතටත් පැමිණ තිබේ. නුඹලා එය අසා දෙවියන් වහන්සේගේ කරුණාව සැබෑවෙන් දැනගත් දා පටන් ඒ නුඹලා අතරේ මෙන් ලුව ලෝකයෙහිත් ඵල දරමින් වර්ධනය වන්නේය. එසේ අප උදෙසා ක්‍රිස්තුස් වහන්සේගේ විශ්වාස සේවකයෙක්ව සිටින අපේ ප්‍රේවවන්ත හවුල් වැඩ කරා වූ එප්‍රස්ගෙන් නුඹලා ඉගෙන ගත්තහුය. ඔහු ආත්මයාණන් වහන්සේ තුළ තිබෙන නුඹලාගේ ප්‍රේමයත් අපට දැන්නුවේය."** (කොලොස්සි 1:6-8)

නිතරම සෝදිසියෙන් සිටින්න

අපගේ ජීවිත ගැන ගණන් දෙන අය ලෙස ප්‍රවේශමෙන්, සෝදිසියෙන් සිටින යහපත් නායකයින් ගැන අපට කෘතඥ විය හැකිය. (හෙබ්‍රෙව් 13:17) නමුත් ඒසමඟම ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට යම් ආකාරයක හානියක් ගෙන දෙන ව්‍යාජ නායකයන්ගේ තර්ජනය ගැන අපි සැමවිටම අවදියෙන් සිටිය යුතුය. පාවුල් පෙන්වා දෙන්නේ **"නමුත් නපුරු මනුෂ්‍යයෝත්, රැවටිලිකාරයෝත් භවටමින්ද, රැවටෙමින්ද වඩ වඩා නරක වන්නෝය."** (2 තිමෝති 3:13) බොහෝ අය ව්‍යාජ ගුරුවරුන්ගේ මාසංය සතුටු කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සත්‍යයට අපහාස වන දේවල් සිදු කරන බවත් අපොස්තුළු පේතෘස් අනතුරු අඟවයි. (2 පේතෘස් 2:2)

එබැවින් අප ඉතා විචක්ෂණශීලි විය යුතු අතර ව්‍යාජ නායකයන්ගෙන් ආරක්ෂා විය යුතුයි. ඔවුන්ගේ හෙළා දැකීම් (නියතය. යුදස් 1:13) අප ඔවුන්ගේ බලපෑමට යටත් නොවීමට නිර්භීත වෙමු. ඒ තුළින් කිසිවෙකුට අපව නොමඟ යැවීමට නොහැකි බව අපි දකිමු. (මතෙව් 24:4)

Reg. No: Dop/News/36/2024
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

පාපයේ ප්‍රයෝගකාරී බව

(චාර්ල්ස් එච්. ස්පර්ජන් විසිනි) (1834 - 1892)

"නුඹලාගෙන් කිසිවෙක් පාපයේ රැවටිලිකාරකමෙන් දැඩි නොවන පිණිස අද යයි කියන තෙක් දවස්පතාව එකිනෙකාට අවවාද කරපල්ලා." (හෙබ්‍රෙව් 3:13)

පාපයේ ප්‍රයෝගකාරී බව වඩාත් විනාශකාරී වේ. අපි අවදිව සිට රහසිගත පාපවලට, වැස්ම සහිත පාපවලට, ජනප්‍රිය පාපවලට, සිත් ඇදගන්නා පාපවලට, රැවටිලිකාර පාප වලට විරුද්ධව යාච්ඤා කළ යුතුය. එසේ යාච්ඤා කිරීමට බරපතල වූ හේතුවක් ඇත. පාපයට රැවටීමේ එකීය බලයක් ඇත. එහි ප්‍රයෝගකාරී බව අප වෙත ළඟාවන ආකාරය අනුව දැකිය හැකිය. පාපය එහි පිළිකුල් සහගත බව හෙළි නොකරයි. එහි භයානක ප්‍රතිවිපාක හෙළිනොකරයි. නමුත් එය අපට වාසිදායක තත්වයන් ලබා දෙමින් ඉතා සියුම් ආකාරයෙන් අප වෙත පැමිණේ. ධෛර්යමත්ව පාපයේ පැවතීම කරුණුකොටගෙන දඬුවම පිළිබඳව සැකයක් ඇති වේ. දෙවියන් වහන්සේ කිව්වාද .. ? යනු සිතේ ඇතිදේව භයේ අත්තිවාරම බිඳ දැමීමට අදහස් කරන ප්‍රශ්නයයි. දේව වචනය කෙරෙහි පාපිෂ්ඨ අවිශ්වාසයේ කුඩා අංශුවක් ආත්මයේ සියලු සිතුවිලිවලට විෂ ඇතුල් කරයි.

පාපය බොහෝ විට පැමිණෙන්නේ හිස් යෝජනාවක් හෝ පරිකල්පනයක් (සිතින් මවාගන්නා වූ සිතුවිලි) ලෙසය. සියුම් (වැදගැම්මකට නැති) කාරණා වැදගැම්මකට නැති කැරකැවෙන එවැනි සිහින, පාපය හටගන්වන්නේය. ඔබ වරදක් කිරීමට හෝ ඒ ගැන කථා කිරීමටවත් සිතන්නේ නැත. නමුත් ඔබඑය ප්‍රසන්න ලෙස සිතන්නෝය. සිතින් මවාගන්නා වූ එම සිතුවිලි දීප්තිමත් දෙයක් ලෙස සලකනු ලබයි. සිතුවිල්ලට සිත ඇදගනු ලබන්නෝය. පසුව නපුරේ මාරාන්තික කාර්යය ආරම්භ කරනු ලබයි. සිතුවිල්ල ආශාව බවට පරිවර්තනය වන අතර ආශාව අරමණදක්වා වර්ධනය වේ. අරමුණු ක්‍රියාව දක්වා මෝරනු ලබයි. පාපය කොයිතරම් ප්‍රයෝගකාරී ලෙස ආත්මය තුළට පැමිණෙනවාද කිව්වොත් එය අප දැනගන්නටත් පෙර (නොදැච්චිතවම) ආත්මය තුළට පැමිණෙයි.

පාපය අපට සහ අපගේ තත්වයන්ට අනුවර්තනය වී තිබේ. හැකියාවක් ඇත. පාපයේ හී කොපුවේ ධනවතුන් සඳහා ඊතලත්, දිළිඳු අය සඳහා පාවිච්චි කරන ඊතලත් ඇත. එය සාර්ථක වී සිටින අයට එක ආකාරයකට ද, අසාර්ථක අයට තවත් ආකාරයකට ද විෂ පොවා ඇත.

ජීවිතය නැමති මුහුදේ සිටින මෙම ප්‍රවීන ධීවරයා සියලු වර්ගවල මාලුන් සඳහා එකම ඇමක් භාවිතා නොකරයි. නමුත් අල්ලාගන්නා වූ මාලුවාව දන්නේය. ඔබ දිළිඳු නම්, ඔබට අනිත් අයට ඊර්ෂ්‍යායා කිරීමට හෝ සොරකම් කිරීමට හෝ දෙවියන් වහන්සේව සැක කිරීමට හෝ ලාභ ලැබීමේ වංක මාර්ග අනුගමනය කිරීමට පොළඹවනු ඇත. ඔබ ධනයෙන් පිරී සිටී නම් පාපය ඔබව හසුකර ගැනීමට වෙනත් ක්‍රමයක් අනුගමනය කරනු ඇත. තමා තුළම සතුටුවීමට, උඩඟුකමට, **ලෞකික විලාසිතාවලට ඩබව ආකර්ෂණය කරයි. අපි අප ගැන දන්නවාට වඩා සාතන් අප ගැන දැන සිටියි. සාතන් අපගේ නොවේරූ ස්ථාන, අපගේ දුර්වල ස්ථාන සහ අපගේ යෞවනයේ බිඳීමක් ඇති වූයේ කුමන සන්ධියේදැයි දැන සිටියි.**

පාපය උතුරු සුළඟ මෙන් මනුෂ්‍යයාගේ ජීවිතය නැවති නිවස තුළට පැවිණ සියලු ඉරි තැලීම් සොයා ගනියි. එමෙන්ම රහසිගතව එම ස්ථානවලට ඇතුල් වී හඬනගන්නෝය. සිංහයෙක් තම ගොදුරට හොරෙන් ළංවෙන්නාක් මෙන් පාපය අප තුළට රිංගා ගනියි. වචන බටර් වලට වඩා සිනිදු නමුත් ඇතුළතින් කඩු ඇදී යන පරීක්ෂාවට එමෙහිවීමට නවී හොඳින් බලා සිටින්න.

පාපයේ දිලිසීම

ඊළඟට, පාපය එහි අරමුණ තුළ රැවටිලිකාරය. මක්නිසාද එය අප ඉදිරියේ තබන අරමුණ එහි සැබෑ ප්‍රතිඵලය නොවේ. අපගේ ගැලවුම්කරුවාණන්ව ප්‍රකෝප කිරීමට හෝ ධර්මිෂ්ඨකමේ අධිකාරිය හිතාමතාම ඉවත් කිරීමට අප පෙළඹෙන්නේ නැත. ඒ කාරණාවල උවමනාවට මේ දේවල් කිරීමට අපට ආරාධනා කරන්නේ නැත. අපි නපුර කිරීමට පෙළඹෙන්නේ වර්තමාන යහපත එයින් ලැබෙනු ඇතැයි යන අදහස යටතේය. මිනිසා සිතන්නේ ඔහු පාපයට යටත් වූ විට ඔහුට අමතර සතුටක් භුක්තිවිඳිය හැකි බවත්, නැතහොත් අමතර ලාභයක් ලබාගත හැකි බවත් නැතහොත් අවම වශයෙන් තමා බිය වන දෙයකින් මිදීමට හැකි බවත්ය. තමා බලාපොරොත්තු වන දේ වෙනුවෙන් ඔහු වැරදි කරයි. කෙටියෙන් කිවහොත් යහපත පැමිණෙන පිණිස ඔහු නපුර කරයි.

මේ අනුව හොඳ යැයි පෙනෙන ඇමක් මාළුන් වන මිනිසුන් ඉදිරියේ සාතන් විසින් එල්ලා ඇත. සෑම අවස්ථාකදීම මෙම අරමුණ වංචා සහගතය. නපුර යහපතට මගපාදන්නේ නැත. පාපය අපගේ සැබෑ ලාභය ප්‍රවර්ධනය කරනනේ නැත. එසේ සිදුවේ යැයි සිතුවොත් අප රැවටීමට හසුවේ. එහෙත් බොහෝ අවස්ථාවලදී මනුෂ්‍යයා පව් කරන්නේ **දෙවියන් වහන්සේගේ නීතිය කඩකිරීම සහ තමාගේ මැවුම්කරුට පිටුපෑවේ සැලසුම සමඟ නොවේ. නමුත් තමාට යමක් ලබාගත යුතු යැයි ඔහු සිතන බැවිනි. ඔහුගේ** විනිශ්චයේ දී ස්වාමී වූ දෙවියන් වහන්සේ ඔහු උදෙසා වඩා යහපත්ව තබා තිබෙන්නේ කුමක්දැයි හොඳින් දැන සිටියි.

පැරණි සර්පයා ගෙනා තර්කය නම්, දෙවියන් වහන්සේ ඔබට වාසිවන දේ ප්‍රතික්ෂේප කරන අතර ඔබ බුද්ධිමත්ව එය ලබාගන්න. ආදම් සහ ඒව තහනම් ගහෙන් ගෙඩි ගෙන කෑවොත් ඔවුන්ගේ ඇස් ඇරෙන බවත් ඔවුන් දෙව්වරුන් මෙන් වන බවත් දෙවියන් වහන්සේ දැන සිටින බව ප්‍රධාන වංචාචාකාරයා ඉඟි කළේය. එබැවින් ඔවුන්ව යටත් කර තබා ගැනීම සඳහා ආකර්ෂණීය ගසේ ගෙඩි (තහනම් ගසේ) ප්‍රතික්ෂේප කළ බව කීවේය. සාතන් අප ඉදිරියේ තබන අරමුණ වැරදිය. පාපයේ විපාකය දිළිසෙන නමුත් එය රන් නොවේ. නමුත් එය රත්තරන් මෙන් වැරදි විනිශ්චය වෙතට අපව තල්ලු කරනු ලබයි. මෙම පාපයේ ප්‍රයෝගකාරී බව සෑම තැනකම පවතියි. වීදියේ, නිවසේ, පුද්ගලික කාරණා තුළ යන සෑම ස්ථානයකදී අප දෙවියන් වහන්සේ තුළ වාසය නොකළොත් මායාකාරී වාතාවරණයක් හටගනී. පැකිලීමක් නොමැතිකමෙන් සහ පටු මාර්ගයෙන් සුළු ප්‍රමාණයකට හෝ ඉවත් වුවහොත් අඩු තරමින් සුළු ප්‍රතිලාභයක්, අමතර ප්‍රමාණයක ලාභයක්, යහපතක් හෝ කළ හැකි යයි අප සිතන්නේ නැද්ද ... ? එය මුලාවකි. එහි පදනම නිරය වේ.

ප්‍රයෝගකාරී තර්ක

මනුෂ්‍යයා භාවිතා කරන්නා වූ ප්‍රයෝගකාරී තර්ක වලින් ද විශේෂයෙන් පාපය ප්‍රකාශ වේ. රහසින් මුමුණන්නා වූ එහි හඬට ඇහුම්කන් නොදෙන්න. කලබලයෙන් කිසිවක් නොකරන්න. එය කුඩා දෙයක් නොවේ නේද.. ? මෙය කුඩා ප්‍රමානයකින්වත් හැකිලෙන්නට අවශ්‍යය නොවන කාරණයකි. එය නිවැරදි නොවූ, පහත්, වැදගැම්මකට නැති දෙයකි. මිත්‍රවරුණි. එහි පාපයේ කුඩා කාරණාවීමට පුළුවන් ද .. ? කුඩා තියුණු කඩුවක් නිසාම එය මාරාන්තික වේ. ස්වාමීන් වහන්සේව වේදනාවට පත්කරන දෙය කුඩා නපුරක් විය නොහැකිය. තහනම් ගහෙන් ඵල නෙලා ගැනීම සෑම ක්‍රියාවකින්ම සරලව තිබුණත් එය මරණය ලොවට ගෙනාවේ එහි සියලු දුක්ඛිත දොම්නස් ද සමගිනි. ඉතා සුලු දෙයක් ලෙස පෙනෙන දෙයට එහි ගමන් මගෙහි සීමාවක් නැති ප්‍රතිවිපාක ඇතිවිය හැකිය.

ඊළඟ පාපය නැගී සිට ප්‍රශ්න අසන්නේය. එනම්, එය ඇත්තටම වැරදිද ..? අපි නිශ්චිතවම නිවැරදි නොවිය යුතුද ..? කාලය වෙනස් විය යුතු නොවේද ...? තත්වයන්, විධානයන් වෙනස් නොකරන්නේ ද ... ? වැරදි කරන්නට කැමති තැනැත්තා තමාට රිංගා යන්නට සිදුරක් (ඉඩක්) සොයති. නිදහසට කරුණක් සෙවීමට පටන්ගත් තැනැත්තා සිටන්නේ සතුරාගේ සීමාවේය. සෑම දෙයකදීම ප්‍රධාන හරයට පක්ෂපාතී සහ තමාගේ රජුට විශ්වාසවන්තව සිටින තැනැත්තා තුලින් ප්‍රශ්න ඇතිවන්නේ කලාතුරකිනි. මක්නිසාද යමක් නිවැරදි බව ඔහුට විශ්වාස නොවූ විට එයට මැදිහත් නොවී සිටියි.

පාපය බොරු චාටු බස් කියන මනුෂ්‍යයාව යම් දුරක් ගෙන යාමට පුළුවන් වුවත් වැඩි දුරක් නොගොස් පහසුවෙන්ම පසු බැස යයි. ඔහු අහිංසක නමුත් අපරාධයේ කෙළවරටම පැමිණිය හැකිය. තමාවම තෘප්තිත් වන ලෙස අනුවනකමින් ඔහු සිතන්නේ තාමට එවැනි බලයක් තිබෙන බවත්.

ඉතිරි කොටස ඊළඟ කලාපයෙන්

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

"මක්නිසාද ඔබගේ කරුණාව අහස දක්වාද, ඔබගේ සැබෑකම වළාකුල් දක්වාද විශාලව තිබේ." (ගීතාවලිය 57:10)